

2020

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

வரையறுக்கப்பட்ட தொலைக் கல்வி நிலையம

Distance Learning Centre

State Owned Institute Under
Ministry of Public Administration

DLC
Distance Learning Centre Ltd.

GLOBAL DEVELOPMENT LEARNING NETWORK
GDLN

අන්තර්ගතය

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව	3
දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පිළිබඳ සටහන	4
දැක්ම හා මෙහෙවර	7
ආයතනික තොරතුරු	8
මානව සම්පත්	9
භෞතික සම්පත්	10
නිෂ්පාදන හා සේවාවන්	11
2020 වර්ෂයේ මූලික වැඩසටහන්	12
මූල්‍ය වශයෙන් වැදගත් සිදුවීම්	17
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	18
බාහිර විගණක වාර්තාව	22
මූල්‍ය ප්‍රකාශන	28
අනුරේක	
වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය	i
නියෝජිතයින් පත් කිරීමේ අයදුම්පත	ii

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව



ගර්ෂෝන් අරුලානන්දම්

මෙම වසර දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය වෙත කැළඹිලිසහගත තත්ත්වයක් සහිත වසරකි. 2020 වසරේ සාම්ප්‍රදායික වැඩසටහන් සමඟ යහපත් ප්‍රතිඵල අත්කරගැනීමට මෙම ඉගෙනුම් මධ්‍යස්ථානය මගින් සැලසුම් කර තිබිණි. එසේ වුවද, වසංගත තත්ත්වය හේතුවෙන් ඉගෙනුම් මධ්‍යස්ථානය තුල හටගත් බලපෑම් හා එය වසාදැමීමට සිදුවීම හේතුවෙන් එමගින් ලබාදෙන පහසුකම් නවතා දැමීමට සිදු විය. වසංගත තත්ත්වය සම්බන්ධයෙන් රජය විසින් පනවන ලද මාර්ගෝපදේශ හේතුවෙන් මාර්ගගත විභාග ද නවතාලන ලදී. එහෙත්, ඩිජිටල් නාක්ෂණය ඔස්සේ ඉදිරියට යන සංවිධානයක් ලෙස මෙම ඉගෙනුම් මධ්‍යස්ථානයේ කාර්යමණ්ඩලය විසින් වාර්තා කිරීමේ හා අභ්‍යන්තර අධීක්ෂණය කිරීමේ කර්තව්‍යයන් බාධාවකින් තොරව පවත්වාගෙන යන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙත නවීන සිතුවිලි රැගෙන යාම මගින් මානව සම්පත් සංවර්ධනය කිරීමෙහි ලා පෙර නොවූ විරූ අවස්ථා සලසා දීම අරමුණු කරගනිමිනි දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පිහිටුවන ලදී. මෙනිසා, ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලය හා කොළඹ පිහිටි ලෝක සෞඛ්‍ය සංවිධාන කාර්යාලය හා එක්ව රටවල් 5ක සහභාගිත්වයෙන් 2020 මාර්තු මාසයේදී අන්තර්ජාතික මාර්ගගත සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී. දැනුම නුවමාරු කිරීමේ කාලීන ප්‍රයත්නයක් ලෙස මෙය පුළුල් ලෙස පිළිගන්නා ලද්දේ වසංගත තත්ත්වයට එරෙහිව සටන් කරන ලද සංවිධානවලට සිය අත්දැකීම් නුවමාරු කරගැනීමට හැකි වූ හෙයිනි.

හොංකොං විශ්වවිද්‍යාලය, ලෝක සෞඛ්‍ය සංවිධානය, කොරියානු සංවර්ධන ආයතනය හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ ඕස්ට්‍රේලියානු සම ආයතනය වන කිලෙන්ඩඩ් ලර්නින් ආයතනය මෙහි අවධානයට ලක් වූ දායකයන් කිහිපදෙනෙකි.

උපායමාර්ගික ලෙස මෙම ඉගෙනුම් මධ්‍යස්ථානය මගින් 2020 අප්‍රේල් මාසයේ සිට සිය වැඩසටහන් රැසක් නොමිලේ ලබා දෙන වැඩසටහන් ලෙස ලබා දීම අරඹන ලදී. නවදුරටත්, අධ්‍යාපන අමාත්‍යාංශය හා පරිගණක සම්පත් මධ්‍යස්ථාන සමඟ අවබෝධයෙන් යුතුව දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය මගින් රටේ මධ්‍යම, උතුරු මැද හා උතුරු පළාත්හි ස්ථානවල දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන කිහිපයක් සම්බන්ධයෙන් සොයාබැලීම් ආරම්භ කරන ලදී. මෙම ඉගෙනුම් මධ්‍යස්ථානයේ තාක්ෂණික කාර්යමණ්ඩලය මාර්ගගත පරීක්ෂණ පැවැත්වීම සඳහා මෙම මධ්‍යස්ථාන භාවිත කිරීමේ හැකියාව අගයමින් සිටියි.

ප්‍රතිලාභමය වශයෙන් 2020 වර්ෂය යහපත් වසරක් නොවුවද, විශේෂයෙන් කලාප වෙත ඩිජිටල් මාර්ගයෙන් පුහුණුව ලබාදීම දක්වා පරිවර්තනය කිරීම උදෙසා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය මගින් ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී.

අප ඉහාමත් කැලඹිලිසහගත වර්ෂ 2020ක් දක්වා පිවිසෙන හෙයින්, අපගේ වටිනාකම්වලට අනුගතව, සේවාදායක අදහස් මගින් ඉදිරියට යන හා නවෝත්පාදන මගින් මග පෙන්වීම් ලබා දෙන සංවිධානයක් ලෙස රැඳී සිටීමට කැමැත්තක් දක්වමු. මේවා සියල්ල ඔස්සේ අප සේවය ලබා දෙන පුද්ගලයින් හා කණ්ඩායම් වෙත අනුපමේය අවස්ථාවන් නිර්මාණය කරදීම අපගේ ඉලක්කය වේ.

ගර්ෂෝන් අරුලානන්දම්
ප්‍රධාන විධායක නිලධාරි,
දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

කොළඹ, ශ්‍රී ලංකාව

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පිළිබඳ සටහනක්

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, ගෝලීය මට්ටමින් යහපත් පුරුදු කෙරෙහි අවධානය යොමු කරමින් රජයේ හා පෞද්ගලික අංශයේ කාර්යමණ්ඩලයේ ධාරිතාවන් වර්ධනය කිරීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා රජය විසින් 2002 වසරේදී ස්ථාපිත කරන ලද ප්‍රමුඛ පෙලේ පුහුණු ආයතනවලින් එකකි. පසුගිය වසර කිහිපය පුරාම, දේශීය සම්පත් ලබාගැනීමෙන් පමණක් නොව, ලෝක බැංකු ආයතනයේ ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයේ සහායද සහිතව එම කාර්යමණ්ඩලයන්ගේ ශාස්ත්‍රීය සහ වෘත්තීයමය දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම මගින් එම කාර්යමණ්ඩල වෙත සේවය ලබා දීමට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට හැකි විය. මෙම ඉගෙනුම් මධ්‍යස්ථානයේ පුහුණු කාර්යයන් සාම්ප්‍රදායික චින්තනයේ සීමාවලින් බැහැරව සිදු කරන අතර, එමගින් ඔවුනොවුන් සංවර්ධනය කරගනිමින් සිය කාර්යසාධනය පැහැදිලි කරගැනීමට උපකාරී වේ.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, ගෝලීය මට්ටමින් යහපත් පුරුදු කෙරෙහි අවධානය යොමු කරමින් රජයේ හා පෞද්ගලික අංශයේ කාර්යමණ්ඩලයේ ධාරිතාවන් වර්ධනය කිරීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා රජය විසින් 2002 වසරේදී ස්ථාපිත කරන ලද ප්‍රමුඛ පෙලේ පුහුණු ආයතනවලින් එකකි. පසුගිය වසර කිහිපය පුරාම, දේශීය සම්පත් ලබාගැනීමෙන් පමණක් නොව, ලෝක බැංකු ආයතනයේ ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයේ සහායද සහිතව එම කාර්යමණ්ඩලයන්ගේ ශාස්ත්‍රීය සහ වෘත්තීයමය දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම මගින් එම කාර්යමණ්ඩල වෙත සේවය ලබා දීමට දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට හැකි විය. මෙම ඉගෙනුම් මධ්‍යස්ථානයේ පුහුණු කාර්යයන් සාම්ප්‍රදායික චින්තනයේ සීමාවලින් බැහැරව සිදු කරන අතර, එමගින් ඔවුනොවුන් සංවර්ධනය කරගනිමින් සිය කාර්යසාධනය පැහැදිලි කරගැනීමට උපකාරී වේ.

වගුව 1: 2020 වර්ෂය සඳහා ආදායම් කාණ්ඩ පහත සඳහන් පරිදි වේ.

ආදායම් කාණ්ඩ	රු.
පරිගණක පාදක කරගත් පුහුණු පහසුකම්	1,467,672.00
මුහුණට මුහුණ පවත්වන පුහුණු පහසුකම්	910,000.00
වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම්	803,275.23
මුහුණට මුහුණ ලබාදෙන කුලී පහසුකම්	185,200.00
පරිගණක පාදක කරගත් කුලී පහසුකම්	358,490.00
මහජන සම්මන්ත්‍රණ	2,096,500.00
මාර්ගගත විභාග	10,441,765.94
	16,262,903.17


වගුව 2 - බදුවලට පෙර ශුද්ධ ලාභය (රු)

	2016	2017	2018	2019	2020
මුළු ආදායම් (මූල්‍ය ආදායම් ඇතුළුව)	48,599,370	69,671,388	67,769,778	73,388,537	24,170,166
මුළු වියදම්	40,757,451	55,552,355	52,651,915	57,676,699	27,969,575
ආදායම් බදුවලට පෙර ලාභය	**7,841,919**	**14,119,033**	**15,117,863**	**15,711,838**	**(3,799,409)**

වගුව 2 - දළ ලාභය (රු)

දළ ලාභය	2016	2017	2018	2019	2020
හරයාත්මක මෙහෙයුම් මගින් ලද ආදායම්	44,262,033	62,953,972	59,779,244	64,674,064	16,262,903
විකුණුම් පිරිවැය	15,528,207	29,154,623	21,572,552	23,138,534	3,001,550
දළ ලාභය	**28,733,826**	**33,799,349**	**38,206,692**	**41,535,530**	**13,261,353**
දළ ලාභ අනුපාතය	**65%**	**54%**	**64%**	**64%**	**81%**

දත්ත 1 වාර්ෂික ප්‍රතිලාභ



ධාරිතා සංවර්ධනය කිරීමේ වැදගත්කම

අද වන විට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදයේ වර්ධනය වන ප්‍රවණතාව, නව නිෂ්පාදන, ක්‍රමවේද, ව්‍යුහ සහ සංකීර්ණතා හා ගෝලීකරණය හා බැඳුණු ඉහළ යන අවදානම් තත්ත්වයන් සලකමින්, ශ්‍රී ලංකා ආර්ථිකය තුල පවත්නා සේවා අංශයේ භූමිකාව රටක ආර්ථික සංවර්ධනය හා ස්ථායිතාව කෙරෙහි බලපාන ප්‍රධාන දායකත්ව සාධක අතරින් එකක් බවට පත්ව ඇත. මෑත වර්ෂවලදී, සිය සේවා සැපයුම් යාවත්කාලීන කිරීමට ඉහළ පෙලේ ආර්ථිකයක් සහිත රටවල් අඛණ්ඩව කටයුතු කරන අතරේදී, සංවර්ධනය වෙමින් පවතින රටවල් විවිධ මාර්ග හරහා සිය ඒක පුද්ගල ආදායම හා ආර්ථික වර්ධනය ඉහළ නංවාගැනීමට උත්සාහ දරමින් සිටිති, විශේෂයෙන්ම ලෝක ආර්ථික වර්ධනයේ ධාවක බලවේගයක් ලෙස ආසියාව නැගීඒම ව්‍යාපාරික පරිසරය තුල සුවිශේෂිව සංවර්ධනය වෙමින් පවතින රටවල හා ඒවායේ සංවිධානවල සේවා අංශය තුල අවස්ථා ඉහළ යාම කෙරෙහි මග පාදා ඇත.

මෙවැනි පසුබිමක් තුල දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ ප්‍රමුඛ වගකීම වන්නේ සිය පුහුණු කාර්යයන් ගෝලීය මට්ටම දක්වා වැඩිදියුණු කර, අවශ්‍යතා සහිත අංශවලට දැනුම හා කුසලතා ලබාදීමේ නවීන මාර්ග අත්පත් කරගැනීමය. අප විසින් නිරුණ විධායක සංවර්ධන වැඩසටහන්, වීඩියෝ සම්මන්ත්‍රණ හා ව්‍යාපෘති කළමනාකරණ වැඩසටහන් ඔස්සේ පුද්ගල සංවර්ධන හා ආයතනික වෙනස්කම් යන ද්විත්වයම සාර්ථකව පවත්වාගෙන ගොස් ඇත. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයට පුළුල් විවිධත්වයක් සහිත සංස්කෘතීන් හා භාෂාවලින් යුක්ත ලෝකයේ විවිධ රටවල වෙනස් ආකාරයේ සංවිධාන සමඟ සම්බන්ධතා පැවැත්වීමේ හැකියාව ඇති හෙයින්, මේ සඳහා සම්බන්ධ වී ඇති සෑම අයෙකුටම ඵලදායී ලෙස දැනුම සහ අත්දැකීම් හුවමාරු කරගැනීමට හැකියාව ඇත.

දැක්ම

මානව සම්පත් සංවර්ධනය හා ආයතනික වෙනස්කම් උදෙසා පවතින
එකම ඩිජිටල් මධ්‍යස්ථානය බවට පත් වීම
අපගේ අවශ්‍යතාවය යි.

මෙහෙවර

අපි සාර්ථක අභ්‍යන්තර ඩිජිටල් පරිවර්තනයක් ගොඩ නගා, පුද්ගල ආවේණික ඩිජිටල් සේවා වර්ධනය කර, ඩිජිටල් ඉගෙනුම් සහ සේවාදායක ආයතන ඩිජිටල්මය වශයෙන් පරිවර්තනය කිරීම සඳහා පවත්නා දැඩි ඉල්ලුම සපුරාලීම සඳහා නැඟී සිටිමු.

අපගේ වටිනාකම්

- නවෝත්පාදක සහ නිර්මාණාත්මක
- සේවාදායක අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන බව
- වැදගත්කම සලකමින් ඒ මත ක්‍රියාකාරී වන බව
- වගකිවයුතුභාවය සහ කැපවීම
- ශක්‍යතා සංවර්ධනය කෙරෙහි විශ්වාසය තැබීම

ආයතනික තොරතුරු

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද්දේ සමාගම් පනත යටතේ 2001 නොවැම්බර් 01 වනදා වන අතර 2002 මාර්තු 26 වනදා එහි මෙහෙයුම් කටයුතු ආරම්භ විය.

මෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 10 ක් වන සාමාන්‍ය කොටස් 14,206,509 කින් සමන්විත වන අතර ඉන් 100% (14,206,509) ක්ම ශ්‍රී ලංකා රජයට හිමි වේ. මෙය රජයේ අයවැය හෝ සහනාධාර මත යැපීමෙන් තොරවූද ස්වයං අරමුදල් යොදවනු ලබන්නා වූද, ව්‍යවසායකත්වයක් වේ.

එමෙන්ම එය, අන්තර්ක්‍රියාකාරී, බහු නාලිකා ජාල සහ නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමයක් වන බහු පාර්ශ්ව විඩියෝ සම්මන්ත්‍රණ, අන්තර්ජාලය සහ වෙනත් උසස් සන්නිවේදන තාක්ෂණයන් යොදාගෙන පිරිවැය ඵලදායී ඉගෙනුම් අවස්ථා හා ධාරිතා සංවර්ධන වැඩසටහන් සපයන ලෝක බැංකු ආයතනයේ ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලයේ කොටසක්ද වේ. එයට වෙනත් ජාත්‍යන්තර පුහුණු ආයතන සමඟද සබඳතා ඇති අතර ශ්‍රී ලංකාව තුළ ඒවායේ පාඨමාලා පැවැත්වීමට වරප්‍රසාද ලද්දේද වෙයි.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය CIMA සහ ACCA මාර්ගගත විභාග සඳහා පරීක්ෂණ මධ්‍යස්ථානයක් වන අතර කොළඹදී එවැනි විශාල සුරක්ෂිත පහසුකම් ලබාගත හැකි එකම ස්ථානය එය වේ. දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය 2017 වසරේදී දකුණු ආසියාවේ විශාලතම CIMA පරීක්ෂණ මධ්‍යස්ථානය බවට පත් වූ අතර සෑම වසරකම විභාග අපේක්ෂකයන් 2000 කට අධික පිරිසකට විභාගයට පෙනී සිටීමට අවස්ථාව සපයනු ලබයි.

මූලික කටයුතු

ගෝලීය දැනුම් බෙදාහැරීම, ඊ -ඉගෙනුම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ පුහුණු කිරීම්, අධ්‍යාපන අංශයේ පුහුණු කිරීම් සහ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවාදායකයන්ට ව්‍යාපාරික හමු හා විඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා ඉහළම මට්ටමේ පහසුකම් සැපයීම. ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර විභාග පවත්වන ආයතන සඳහා සුරක්ෂිතව මාර්ගගත විභාග පැවැත්වීමේ පහසුකමද දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් සපයනු ලැබේ.

ලියාපදිංචි කාර්යාලය
28/10, මලලසේකර මාවත, කොළඹ 07

විගණකවරු
විගණකාධිපති, ශ්‍රී ලංකාව

ලේකම්වරු
Accounting Systems Secretarial Services (Private) Limited.

බැංකුකරු
ලංකා බැංකුව

මානව සම්පත්

කළමනාකරණ කණ්ඩායම

ප්‍රධාන විධායක නිලධාරී



ගර්ෂෝන් අරුලානන්දම්
ACIM (UK), FIM (SL), MBA (Peradeniya)

තොරතුරු තාක්ෂණ කළමනාකරු



අරුණ බුද්ධික
MSc SITM (UK), ACS

ඉගෙනුම් සංවර්ධන හා අලෙවිකරණ කළමනාකරු



කීර්ති විජේසේකර
MCIM (UK), AABE (UK) MBA Uni Sunderland UK,
MSc HRM & Dev. University of Salford UK

මූල්‍ය හා පරිපාලන කළමනාකරු



ලක්ෂිකා කළුබෝවිල
BBA (Sp) 2nd Upper (Hons.),
MBA (Colombo), CBA , MAAT

සහකාර අලෙවි කළමනාකරු



වජිර අබේනායක
Advance Diploma in Business Management
(NIBM)

අපගේ කණ්ඩායමේ අනෙක් සාමාජිකයන්



වමේ සිට

සුලේඛ දිසානායක (පරිපාලන සහකාර),
නිරෝෂා ප්‍රියදර්ශනී (වැඩසටහන් සම්බන්ධීකරණ),
ලක්මාලි සමරසේකර (විධායක ලේකම්),
ධනුෂ්කා දුෂන්ති (ලේඛක සහකාර),
නයනී කල්පගේ (හිඳුම් සහකාර),
රොමේෂ් පෙරේරා (තොරතුරු තාක්ෂණ සහකාර)

භෞතික සම්පත්

නවීනතම තත්ත්වයේ වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම

පුද්ගලික මයික්‍රෆෝන සහිත සක්‍රිය සහභාගිවන්නන් 30 ක් හා අනෙකුත් නිරීක්ෂකයන් 50 කට පහසුකම් සැපයිය හැකිය.














පරිගණක සහිත බහු මාධ්‍ය කාමර ද්වය

එකක් පරිගණක 30 කින්ද අනෙක පරිගණක 50 කින්ද සමන්විතය

Pearson VUE Testing Center

(ආසන 90 කින් සමන්විතය)





අවශ්‍ය විට දේශන කාමරයක් ලෙස භාවිතා කළ හැකි ඉඩකඩ සහිත ලොබිය

සියලුම සම්මන්ත්‍රණ කාමර සඳහා ඔඩියෝ සංවාද පහසුකම් ඇත

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ඔස්සේ පහත සේවාවන් සපයනු ලබයි

- සංකලිත ඉගෙනුම් ක්‍රම භාවිතයට ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය, ස්වභාවික සම්පත් කළමනාකරණය හා විද්‍යාව සහ දේශගුණ විපර්යාස පිළිබඳ ප්‍රතිපත්තිය යනාදී තේමා ඔස්සේ පවත්වනු ලබන සහතික පත්‍ර පාඨමාලා
- විපත් අවස්ථාවන්හිදී හෙද සත්කාර සහ Partograph යනාදී විෂයයන් සම්බන්ධයෙන් ලොව පුරා පවතින විවිධ සම්පත් මධ්‍යස්ථාන මගින් සපයනු ලබන පුහුණු වැඩසටහන් සමග වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ඔස්සේ සම්බන්ධ වීම
- ලොව වෙනත් ප්‍රදේශවල වෙසෙන කිර්තිමත් කථිකයින් (ඒ ඒ විෂයයන්හි ප්‍රවීණයින්) විසින් පවත්වනු ලබන කෙටි සම්මන්ත්‍රණ සහ ඉදිරිපත්කිරීම්
- කොරියානු සංවර්ධන අත්දැකීම් වැනි තේමා ඔස්සේ විවිධ රටවල් සම්බන්ධ කරමින් පවත්වනු ලබන ගෝලීය අත්දැකීම් හුවමාරු කරගැනීමේ සංවාද
- වෙබ් යෙදුම් ආරක්ෂණය (Web Application Security) වැනි පාරිභෝගික අවශ්‍යතාවන් සැපිරීම සඳහා ඒ ඒ පුද්ගලයින් හෝ කාර්යයන් සඳහා සැකසූ පුහුණු වැඩසටහන්
- වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම ඔස්සේ ව්‍යාපාරික සම්මන්ත්‍රණ හා හමු, ශාස්ත්‍රීය සංවාද සහ දේශ සීමා අතර පවුලේ උත්සව යනාදිය පැවැත්වීම සඳහා පහසුකම් කුලියට සැපයීම

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් එහි බහු මාධ්‍ය පහසුකම ඔස්සේ පහත සේවාවන් සපයනු ලබයි

- සංවර්ධනය වෙමින් සිටින තරුණ විධායකයින් ගෝලීය ප්‍රවණතාවන්ට නිරාවරණය කරන්නා වූ වැඩසටහන්
- බඳවාගැනීම් සහ උසස්වීම් සඳහා පරිගනක පාදක කරගත් විභාග
- ඊ -ඉගෙනුම් භාවිතා කරමින් ඒ ඒ පුද්ගලයින් හෝ කාර්යයන් සඳහා සැකසූ විදේශීය හා දේශීය පුහුණු වැඩසටහන්
- පරිගනක පුහුණුව (පරිගනක පිළිබඳ අත්‍යවශ්‍ය දැනුම (Computer Essentials) , ජාත්‍යන්තර පරිගනක ධාවන බලපත්‍රය, ශ්‍රී ලංකා පරිගනක ධාවන බලපත්‍රය, උසස් ඊ -කාර්යාල නිපුණතා යනාදිය)
- ව්‍යාපෘති කළමනාකරණය, ඉදිරිපත් කිරීමේ කුසලතා, ප්‍රකාශන කුසලතා, ඊ ඉගෙනුම් අන්තර්ගතය සංවර්ධන කුසලතා යනාදිය පිළිබඳ පරිගනක පාදක කරගත් පුහුණු
- ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු,මෘදුකාංග ප්‍රවර්ධන කටයුතු සහ පරිගනක පාදක කොටගත් පුහුණු සහ පරිගනක/ අන්තර්ජාලය පාදක කොටගත් විභාග සඳහා අවශ්‍ය පහසුකම් කුලියට සැපයීම

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් එහි පහසුකම් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ සේවාවන් ශ්‍රව්‍ය සම්මන්ත්‍රණ මෙන්ම මුහුණට මුහුණලා පැවැත්වෙන පැවැත්වෙන කටයුතු සහ විභාග (පරිගනක පාදක කොටගත් සහ අනෙකුත් විභාග) සඳහා කුලියට සපයනු ලැබේ.

වැඩිදුර තොරතුරු සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වෙබ් අඩවියට පිවිසෙන්න

www.dlcsrilanka.org

මෙයට අමතරව දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් පහත සේවාවන්ද සපයනු ලැබේ

- ඊ -ඉගෙනුම් මූලාරම්භයන් සඳහා අවශ්‍ය අන්තර්ගතයන් සකස් කිරීම, පරිවර්තනය සහ ඒවා සංයුක්ත තැටි ලෙස සැකසීම
- කාර්යයන් ලේඛනගත කිරීම (ඩිජිටල් සහ මුද්‍රිත)
- සේවාලාභීන්ගේ අවශ්‍යතා සැපිරීම සඳහා සුදුසු අපේක්ෂකයින් බඳවාගැනීම සඳහා විභාග සැලසුම් කිරීම

2020 වසරේ ප්‍රධාන පුහුණු වැඩසටහන්වල සාරාංශය

- ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ප්‍රසම්පාදනය, විනය කටයුතු පිළිබඳ ක්‍රමවේදය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණවේදය පිළිබඳව දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් පවත්වන ලද පාඨමාලාවල සහතික ප්‍රදානය කිරීමේ උත්සව අවස්ථාව. 200ක් වන මුළු පිරිසක් මෙම පාඨමාලාවන් සාර්ථකව නිම කරන ලදී. 2020 ජනවාරි





- පෙබරවාරි මාසයේදී ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අනුයුක්තව සිටින නිලධාරීන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණවේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව ආරම්භ කිරීම.




- කෝවිඩ් - 19 පිළිබඳව ගෝලීය සංවර්ධන ඉගෙනුම් ජාලය සමඟ සහයෝගයෙන් පවත්වන ලද දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ විඩියෝ සම්මන්ත්‍රණය.





- ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සහ එතෙර පිහිටි එහි සමගාමී ආයතනය සමඟ පවත්වන ලද විඩියෝ සම්මන්ත්‍රණය




- කලාපය තුල කෝවිඩ් 19 පැතිරයාමට එරෙහිව සටන් කිරීමේ අත්දැකීම් හුවමාරු කරගැනීම පිණිස, සාර්ක් රටවල ජ්‍යෙෂ්ඨ සෞඛ්‍ය වෘත්තිකයින්ගේ වීඩියෝ සමුළුවක් මාර්තු 26 වන දින පවත්වන ලදී.





- රට වසා තබා තිබූ කාලසීමාව තුල දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් අන්තර්ක්‍රියාකාරී ඩිජිටල් වේදිකා භාවිත කරමින් වෙබිනාර් මාලාවක් පවත්වන ලදී.












- දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය මගින් සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය වෙනුවෙන්, ඵලදායී මාර්ගගත අධ්‍යාපනය, යන මැයෙන් වැඩමුළු මාලාවක් පවත්වන ලදී. මෙම ප්‍රහුණු වැඩසටහන සඳහා ආයතනයට අනුයුක්තව සේවය කරන රට පුරා ව්‍යාප්තව සිටින විදුහල්පතිවරු සහ දේශකවරු එක්ව සිටියහ.





- රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පවත්වන ලද රාජ්‍ය අංශයේ විනය කටයුතු පිළිබඳ ක්‍රමවේදය සම්බන්ධ සහතික පත්‍ර පාඨමාලාව 01වන කණ්ඩායම විසින් සම්පූර්ණ කිරීම. රාජ්‍ය අංශයේ සංවිධාන 14ක නිලධාරීන් 25දෙනෙකු විසින් මෙම වැඩසටහන සාර්ථකව නිම කරන ලදී.



- ගම්පහ අධ්‍යාපන කලාපය සඳහා අධ්‍යාපනික ජයග්‍රහණ ඉහළ නැංවීම, යන මැයෙන් ධාරිතා සංවර්ධන වැඩසටහනක් සාර්ථකව පවත්වන ලදී.



කලාපීය විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ උපායමාර්ගික ප්‍රයත්නයන්

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය පහත සඳහන් ක්ෂේත්‍රයන්හි පරිගණක සම්පත් මධ්‍යස්ථාන සඳහා අනුමැතිය ලබාදෙන ලදී

ගුරුදෙණියෙහි පිහිටි අනුමැතිය ලත් පරිගණක සම්පත් මධ්‍යස්ථානය



පරිගණක සම්පත් මධ්‍යස්ථානය - ඉබ්බාගමුව
පරීක්ෂාවට ලක් කළ දිනය : 2020 අගෝස්තු 18





වැදගත් : තොරතුරු තාක්ෂණය පදනම් වූ පුහුණු වැඩසටහන් සහ විභාග පැවැත්වීමට මෙම මධ්‍යස්ථානය සූදානම් කර ඇත.

පරිගණක සම්පත් මධ්‍යස්ථානය - බලංගොඩ
පරීක්ෂාවට ලක් කළ දිනය: 2020 අගෝස්තු 25





වැදගත් : තොරතුරු තාක්ෂණය පදනම් වූ පුහුණු වැඩසටහන් පමණක් පැවැත්වීමට මෙම මධ්‍යස්ථානය සූදානම් කර ඇත.

පරිගණක සම්පත් මධ්‍යස්ථානය - කුරුවිට
පරීක්ෂාවට ලක් කළ දිනය : 2020 අගෝස්තු 25





වැදගත් : තොරතුරු තාක්ෂණය පදනම් වූ පුහුණු වැඩසටහන් පමණක් පැවැත්වීමට මෙම මධ්‍යස්ථානය සූදානම් කර ඇත.

පරිගණක සම්පත් මධ්‍යස්ථානය - වඩමාරච්චි
පරීක්ෂාවට ලක් කළ දිනය: 2020 සැප්තැම්බර් 04








වැදගත් : තොරතුරු තාක්ෂණය පදනම් වූ පුහුණු වැඩසටහන් සහ විභාග පැවැත්වීමට මෙම මධ්‍යස්ථානය සූදානම් කර ඇත.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ විඩියෝ සම්මන්ත්‍රණ කටයුතු

මාර්ගගතව පවත්වනු ලබන ජාත්‍යන්තර වැඩසටහන්වලට අමතරව, විඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමය මඟින් සංක්‍රමණය සඳහා සම්මුඛ පරීක්ෂණ සිදු කිරීමට, ඊ ඉගෙනුම් වැඩසටහන්, අධිකරණ කටයුතු, මණ්ඩල රැස්වීම් හා ජාත්‍යන්තර සමුළු පැවැත්වීමට මෙම මධ්‍යස්ථානය ද බොහෝ සේවාදායකයින්ගේ සිත්ගත් ස්ථානයකි.







පහත දැක්වෙන්නේ 2020 වසරේදී විඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමය මඟින් පවත්වන ලද අවස්ථා කිහිපයකි.

1. PESCII වෛද්‍යවරුන් සඳහා ජාත්‍යන්තර සම්මුඛ පරීක්ෂණ - සම්මුඛ පරීක්ෂණ 5
2. ජාත්‍යන්තර මණ්ඩල රැස්වීම - ත්‍රිකුණාමලය විදුලි බලාගාරය (ලංකා විදුලිබල මණ්ඩලය) - 2019 සැප්තැම්බර් 19
3. ජාත්‍යන්තර ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ජාත්‍යන්තර VC සමුළුව - 2019 ජූලි 8

පසුගිය වසර පහේ මූල්‍ය ප්‍රගතිය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රතිඵල සාරාංශය	2020	2019	2018	2017 (නැවත ප්‍රකාශිත)	2016
	රු.මිලි.	රු.මිලි.	රු.මිලි.	රු.මිලි.	රු.මිලි.
ආදායම්	**16.2**	64.6	59.8	62.9	44.3
වෙනත් ආදායම්	**7.8**	8.5	7.8	6.5	4.1
මුළු ආදායම්	**24.0**	73.1	67.6	69.6	48.4
මුළු වියදම්	**27.9**	57.6	52.5	55.5	40.6
වර්ෂය සඳහා ශුද්ධ ලාභය					
බදුවලට පෙර	**-3.79**	15.7	15.1	14.1	7.8
කාර්යමණ්ඩල පිරිවැය	**13.0**	13.4	13.0	11.7	10.5
කාර්යමණ්ඩලයේ ප්‍රමාණය	**11**	12	12	11	10
දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය	2020	2019	2018	2017 (නැවත ප්‍රකාශිත)	2016
	රු.මිලි.	රු.මිලි.	රු.මිලි.	රු.මිලි.	රු.මිලි.
ප්‍රකාශිත ප්‍රාග්ධනය	142.6	142.6	142.06	142.06	142.06
ගිවිසුම යටතේ රජය වෙත නැවත ගෙවිය යුතු ජංගම නොවන වගකීම්	-	-	3.2	6.4	9.6
ජංගම වගකීම්	3.97	4.2	6.9	5.5	1.7
මුළු මුදල් සමානයන් / වගකීම්	135.2	139.3	130.3	115.7	100 7
කෙටි කාලීන ආයෝජන	78.2	68.9	84.0	68.8	53.6
කාරක ප්‍රාග්ධනය	74.8	75.1	88.1	73.1	60.9
මුළු වත්කම්	135.2	139.3	130.3	115.7	100.7



අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී/ස දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය - පිබී 192

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම්කරණ ප්‍රකාශ සමග සිය වාර්තාව ඉදිරිපත් කිරීමෙහි ලා අධ්‍යක්ෂවරු සිය ප්‍රසාදය පල කරති.

1. **මූලික කටයුතු සහ මෙහෙයුම්හි ස්වභාවය**

සුවිශේෂිව ගෝලීය දුරස්ථ ඉගෙනුම් ජාලය භාවිත කරමින් රාජ්‍ය කළමනාකරණ හා ආර්ථික සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර විශේෂඥයින් සමඟ අන්තර්ක්‍රියාකාරී වීම් උදෙසා තොරතුරු හා අවස්ථා යාවත්කාලීන කිරීමට ප්‍රවේශය ලබාගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයින් වෙත පහසුකම් සලසාලීම පිණිස, වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු හා වෙනත් ක්‍රියාකාරකම් සංවිධානය කර, පවත්වාලීම සමාගමේ ප්‍රධානතම ව්‍යාපාරික කටයුතු අතර වේ.

2. **අධ්‍යක්ෂවරුන්**

2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂවරුන් වූයේ:

වසන්තා පෙරේරා මහත්මිය - සභාපති

කේ.ඒ. රම්‍යා කාන්ති මහත්මිය - අධ්‍යක්ෂ

3. **මූල්‍ය ප්‍රකාශ**

සමාගමේ මූල්‍ය ප්‍රකාශ වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇත.

4. **විගණකවරයාගේ වාර්තාව**

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව වාර්ෂික වාර්තාවෙහි සඳහන් කර ඇත.

5. **ගිණුම්කරන ප්‍රතිපත්ති සහ ගිණුම්වලට යොදන සටහන්**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් වාර්ෂික වාර්තාවේ සඳහන් වන අතර, අදාල කරගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වැදගත් වෙනස්කමක් සිදු කර නැත.

6. **පොලී ලේඛනය**

2007 අංක 7 දරන සමාගම් පනතේ 192 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් පොලී ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි.

7. **කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත**

මූල්‍ය ප්‍රකාශවල සටහන 23ට අනුව, අධ්‍යක්ෂවරුන් වන වසන්තා පෙරේරා මහත්මිය සහ කේ.ඒ. රම්‍යා කාන්ති මහත්මිය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සමාගමේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කැමැත්ත පල නොකළහ.

8. **අධ්‍යක්ෂවරුන්ගේ දීමනා හා වෙනත් ප්‍රතිලාභ**

මූල්‍ය ප්‍රකාශවල සටහන 08ට අනුව, අධ්‍යක්ෂවරුන් වෙත මණ්ඩල රැස්වීම් හා විගණන කමිටු රැස්වීම්වලට සහභාගිවීම් වෙනුවෙන් ගෙවන ගාස්තු සහ සභාපතිවරයාට ගෙවනු ලබන දීමනාව ගෙවන ලදී.

9. ශේෂපත්‍රයේ දිනට පසුව එළඹෙන ලද සිදුවීම්

වාර්තා කරන කාලසීමාවෙන් පසුව එළඹෙන සිදුවීම්හි වැදගත්කම සලකා බලා අවශ්‍ය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශ තුල යෝග්‍ය ගැලපුම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

10. බදුකරණය

ආදායම් ප්‍රකාශයට අනුව, **2020** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අඩු කරන ලද බදු ප්‍රමාණය රු.**566,930/-** කි.

11. ව්‍යවස්ථාපිත ගෙවීම්

සිය දැනුමට හා විශ්වාසයට අනුව රජයට හා සේවකයින්ට අදාල සියලුම ගෙවීම් නිසි කලට සිදු කර ඇති බවට අධ්‍යක්ෂවරු සැහීමකට පත් වෙති.

12. ප්‍රාග්ධන වගකීම් සහ අනපේක්ෂිත වගකීම්

යම් අතීත සිදුවීමක් හේතුවෙන් හටගැනීමට හැකි වත්කම් හෝ වගකීම් අනපේක්ෂිත සිදුවීම් වන අතර, සමාගමේ පාලනයෙන් තොර අස්ථිර අනාගත සිදුවීම් හටගැනීම් හෝ හට නොගැනීම් මත පමණක් තහවුරු කළ හැකි වේ.

13. විගණකවරුන්

ජාතික විගණක කාර්යාලය සමාගමේ වර්තමාන විගණකවරුන් වන අතර, ඉදිරියේදී පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී ඉදිරි වසර සඳහා සමාගමේ විගණකවරුන් ලෙස නැවත පත් කෙරෙනු ඇත.

මෙම මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික විගණක ගාස්තුව සහ ගෙවිය යුතු ගෙවීම් ලෙස රු.300,000/-ක් වෙන් කරන ලදී.

14. වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2023 පෙබරවාරි 21වන අඟහරුවාදා දින ප.ව.2.30ට කොළඹ 7, මලලසේකර මාවත, අංක 28/10හිදී පැවැත්වෙනු ඇත.

සී/ස දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය මත

සී/ස ACCOUNTING SYSTEMS SECRETARIAL SERVICES පෞද්ගලික සමාගම

ලේකම්වරුන්

....

අධ්‍යක්ෂ *අධ්‍යක්ෂ*

.....

ලේකම්වරුන්

දිනය : **2023** පෙබරවාරි **02**

බාහිර විගණකවරයාගේ වාර්තාව

සභාපති
සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය 2020 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ව ප්‍රකාශ සහ අනෙකුත් නීති රෙගුලාසි සම්බන්ධව 2018, අංක 19 දරන මුදල් පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්වගණනය කල මතය**

සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය ආයතනයේ 2020 දෙසැම්බර් 31 වන දිනට සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධාන යටතේ විගණනය කරන ලදී. මාගේ වාර්තාව ව්‍යවස්ථාවේ අංක 154(6) අංශයන්හි නියාමන විධිවිධාන අනුගමනය කරමින් නියමිත දිනවකවානු වලදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

මාගේ මතය අනුව මෙම වාර්තාවේ අඩංගු තත්වගණනය කල මතයන්හි ඉදිරිපත් කර ඇති යම් සුවිශේෂී කරුණු සහ එහි බලපෑම් හැරුණු විට අනෙකුත් මූල්‍ය ප්‍රකාශන 2020 දෙසැම්බර් 31 දින වන විට මෙම සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය සහ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් සංසරණය පිලිබඳව කුඩා සහ මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දේ.

1.2 **තත්වාගණනය කල මතය සඳහා වූ පදනම**

අ) පූර්ණ ලෙස ක්ෂය වූ රු 51,664,931 ක් වටිනා ස්ථාවර වත්කම් අබණ්ඩව භාවිතා කර ඇති අතර කුඩා හා මධ්‍ය පරිමාණ අස්පිත්වයන් පිලිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි දේපළ පිරියත උපකරණ පිළිබඳ 17 වන වගන්තිය අනුව එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නැත.

මාගේ විගණන වාර්තාව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව සිදු කර ඇත. එම ප්‍රමිතීන් හා සම්බන්ද මා සතු වගකීම් මෙම වාර්තාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන කොටසේ විගණනකගේ වගකීම් යටතේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්වගණනය කල මතයෙහි පදනම් සඳහා අවශ්‍ය තරම් නිවැරදි තොරතුරු සහ විගණන සාක්ෂි මම විසින් ලබාගෙන ඇති බව විශ්වාස කරමි.

1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙක් තොරතුරු

අනෙකුත් තොරතුරුවලට සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු අයත් වන නමුත් මූල්‍ය ප්‍රකාශන සහ මෙම විගණකාධිපති වාර්තාවට පෙර ඒ පිළිබඳව මගේ වාර්තාව අයත් නොවේ. කළමනාකාරිත්වය වෙනත් තොරතුරු සඳහා වග කියනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ අදහස අනෙක් තොරතුරු ආවරණය නොකරන අතර එහි නිගමනයන් පිළිබඳව මම කිසිදු සහතියකක් ලබා නොදෙන්නෙමි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර දිනක මා ලබාගත් තොරතුරු සම්බන්ධව මා සිදු කළ කටයුතු මත පදනම් වන්නේ නම් මෙහි වෙනත් කරුණුවල ද්‍රව්‍යාත්මක අවප්‍රකාශයක් ඇති බවට නිගමනය කරමි. මේ සම්බන්ධයෙන් කිසිවක් වාර්තා නොකරමි.

1.4 කළමනාකාරිත්වයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන හා සම්බන්ධ පාලනාධිකාරී බලතල ඇති අය පිළිබඳ වගකීම්

කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් සහිත මූල්‍ය තත්ත්ව සම්පාදනය කිරීම සම්බන්ධව කළමනාකාරිත්වය වග වියයුතු අතර එවැනි මූල්‍ය තත්ත්ව සම්පාදනය කිරීමේදී ඒවා ප්‍රමාණාත්මක සාවධාන ප්‍රකාශයන්ගෙන් තොර වියයුතු බවට කළමනාකාරිත්වය නිවරදිව තහවුරු කරගත යුතුය.

මූල්‍ය තත්ත්ව සම්පාදනය කිරීමේදී, කළමනාකාරිත්වය විසින් ව්‍යාපාරය ඇවර කිරීමට හෝ සම්පූර්ණයෙන් අත්හිටුවීමට හෝ වෙනත් යථාර්තවාදී විකල්පයක් නොමැති අවස්ථාවකදී හැර අදාල සමාගම සතු ලාභදායී ව්‍යාපාරයක් ලෙස ඉදිරියට පවත්වාගැනීමේ හැකියාව සහ අවශ්‍ය පරිදි කරුණු හෙළිදරවු කිරීම ඇතුළු ලාභදායී ව්‍යාපාරයක් සම්බන්ද තොරතුරු සහ එහි ගිණුම්කරණ පදනම් තක්සේරු කිරීමට කළමනාකාරිත්වය වගවියයුතුය.

වගකීම් පැවරී ඇති අය සමාගමේ මූල්‍ය තොරතුරු සම්පාදනය කිරීම පිලිබඳ වගවිය යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 16 (1) කොටසට අනුරූපව ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සම්බන්දව නිවැරදි පොත්පත් සහ වාර්තා පවත්වා ගැනීමට සහ ඒ හරහා වාර්ෂික සහ කලාවර්තීන මූල්‍ය තත්ත්ව වාර්තා සම්පාදනය කිරීමට අදාල සමගම සමත්විය යුතු යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වගකීම්

මාගේ විගණනය මත පදනම්ව, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ප්‍රමාණාත්මක සාවධාන ප්‍රකාශයන්ගෙන් තොර, වංචා හෝ වැරදි අන්තර්ගත නොවන සාධාරණ තහවුරුවක් ලබාදිය හැකි, එමෙන්ම මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ මතය ද සහිත විගණන වාර්තාවක් ලබාදීම අරමුණ වේ. සාධාරණ තහවුරුවක් ලබා දී තිබීම පමණක් වුවද යම් ඉහල මට්ටමක තක්සේරුවක් පිලිබඳ අදහසක් ඇති කලද ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව සිදුකෙරෙන විගණනයන්හි දී වුව ද ප්‍රමාණාත්මක

සාවධාන ප්‍රකාශයන් මගහැරීම සිදුවියහැක. සාවධාන ප්‍රකාශයන් වංචා හෝ වැරදීම් වල ප්‍රතිඵලයන් ලෙස ඇතිවිය හැකි අතර ඒවා ප්‍රමාණාත්මක වීමට තනි තනිව හෝ එකතුවක් වශයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශන මත ගනු ලබන වාණිජමය තීරණ සඳහා බලපෑම් කල යුතුය.

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට අනුකූලව මෙම විගණනය සිදු කර ඇති අතර එම සමස්ත විගණන ක්‍රියාවලිය තුල අවශ්‍ය වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සන්දේහවාදය පවත්වා ගන්නා ලදී. එසේම:

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන්හි වංචා සහගත හෝ වැරදි ප්‍රමාණාත්මක සාවධාන ප්‍රකාශයන් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම, එම තත්වයන්ට සංවේදී විගණන ක්‍රියා පටිපාටීන් ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම, එමෙන්ම මාගේ මතය සඳහා වන පදනම වෙනුවෙන් වූ විගණන සාක්ෂි එකතු කිරීම. වංචාව නිසා සිදුවන ප්‍රමාණාත්මක සාවධාන ප්‍රකාශයක් නිවැරදිව ග්‍රහණය කර නොගැනීම වැරදීමක් නිසා සිදුවන ප්‍රමාණාත්මක සාවධාන ප්‍රකාශයක් හරහා සිදුවන හානියට වඩා බරපතල වනුයේ ඒවා දුස්සන්ධාන, ව්‍යාජ අන්සන් යෙදීම, අභිප්‍රායික පැහැර හැරීම, ව්‍යාජ පෙනීසිටීම් හෝ අභ්‍යන්තර පාලනයන් නොසලකා කටයුතු කිරීම වැනි තත්වයන් සමඟ බැඳී ඇති හෙයිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයන් පිලිබඳ අවබෝධයක් ඇතිකර ගැනීම වැදගත් වනුයේ එම අභ්‍යන්තර පාලනයන්හි ඵලදායිතාව පිලිබඳ මතයන් ඉදිරිපත් කිරීමට නොව, එම සමාගම්වලට අනුරූපව විගණන ක්‍රියාපටිපාටීන් සම්පාදනය කරගැනීමටය.

- කළමනාකාරිත්වය විසින් භාවිත කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ තක්සේරු වාර්තාවල සාධාරණත්වය සහ අනාවරණයන් ඇගයීමට ලක් කිරීම.

- සුදුසුතාවය මත කළමනාකරණය භාවිතාව තුලින්, ගිණුම්කරණය මත පදනම් වූ විගණන සාක්ෂි මත පිහිට අඛණ්ඩව ලාභ ලබන ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට සමාගම සතු හැකියාව අභියෝගයට ලක්කෙරෙන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පැවතීම නිශ්චය කරන්න. එවැනි ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් ඇති බවට මා විසින් නිගමනය කරන ලද අවස්ථාවන් වලදී ඒ පිලිබඳ මාගේ විගණන වාර්තා තුලින් අදාළ මූල්‍ය තත්ව වාර්තා ප්‍රකාශනයන් සඳහා කරුණු ඉදිරිපත් කිරීමටත්, මාගේ මතය ප්‍රමාණවත් නොවන අවස්ථාවන් වලදී සංශෝධන ඉදිරිපත් කිරෙමටත් කටයුතු කෙරෙනු ඇත. මාගේ නිගමනයන් විගණන වාර්තා සම්පාදනය කරන ලද අවසාන දිනය දක්වා එකතු කරන ලද විගණන සාක්ෂි මත පදනම් වන අතර නවදුරත් සිදුවන ක්‍රියාකාරකම් සහ සිදුවීම් සමගම ලාභ ලබන ව්‍යාපාරයක් ලෙස ඉදිරියට පවත්වාගෙන යෑම අඩපන කිරීමට හේතු විය හැක.

- කරුණු අනාවරණය කිරීම ඇතුළු මූල්‍ය තත්ත්ව ප්‍රක්ෂනවල ව්‍යුහය, සමස්ථයක් වශයෙන් ගත විට කරුණු ඉදිරිපත් කිරීම සහ මූල්‍ය තත්ත්ව වාර්තා හරහා අදාල ගනුදෙනු හා ක්‍රියාකාරකම්වල සාධාරණ කරුණු ඉදිරිපත් කිරීමක් ඇති බව ඇගයීමට ලක් කර ඇත.

මූල්‍ය විගණන ක්‍රියාපටිපාටිය අතරතුර අභ්‍යන්තර පරිපාලන දුර්වලතා ඇතුළු අනෙකුත් විගණනය ආශ්‍රිත සොයාගැනීම් පිලිබඳ පාලනාධිකාරී බලතල සහිත අංශ සමඟ මනා අවබෝධයක් සහිතව කරුණු හුවමාරු කරගැනීමට කටයුතු කරන ලදී.

2. නෛතික සහ අනෙකුත් නියාමනයන් සම්බන්ධ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 2007 අංක 07 දරන සමාගම් පනත පහත සඳහන් කරුණු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ඇත.

2.1.1 නත්වගණනය කල මතය සඳහා වූ පදනම හරහා කරුණු දක්වා ඇති ගැටළු සහ ඒවායේ බලපෑම් හැරුණු විට මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු කරුණු සහ පැහැදිලි කිරීම් එක්රැස් කරගන්නා ලදී. එසේම එම කරුණු සහ පැහැදිලි කිරීම් ඉතා සාධනීය ලෙස මාගේ වාර්තා තුල යොදාගෙන ඇති අතර එම කරුණු සහ පැහැදිලි කිරීම් පවත්වාගෙන යාම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 163 (1) (d) කොටසේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (a) කොටසේ දැක්වෙන ප්‍රතිපාදන වලට අනුරූපව සමාගම විසින් පවත්වාගෙන යෑම සිදුකර ඇත.

2.1.1 ව්‍යාපාරයේ මූල්‍ය නත්ත්ව වාර්තාව 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 151 කොටසේ දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූල වේ.

2.1.2 ඉදිරිපත් කර ඇති මූල්‍ය නත්ත්ව වාර්තා 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි අංක 6 (1) (d) (iii) කොටසේ දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූල වේ.

2.1.3 පසුගිය වසර සඳහා මා විසින් සම්පාදනය කල සියලු නිර්දේශයන් ඇතුලත් මූල්‍ය නත්ත්ව වාර්තා 2018 අංක 19 ජාතික විගණන පනතෙහි 6 (1) (ඉ) (සඩ) කොටසේ ප්‍රතිපාදනවලට අනුරූපව සිදුකර ඇත.

2.2 සිදු කරන ලද ක්‍රියාපටිපාටීන් සහ ලබාගන්න ලද සාක්ෂි අනුව, පැවති නත්වයන් සියල්ල ප්‍රමාණාත්මක වන අතර අන් කිසිදු නත්වයක් මාගේ විශේෂ අවධානයට යොමු නොවුනි.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (d) කොටසේ ප්‍රතිපාදනවලින් බැහැරව සමාගමේ පරිපාලන ව්‍යුහයේ සාමාජිකයකු සෘජුව හෝ වක්‍රව සිදුකරනු ලබන මැදිහත් වීම් හරහා ලබාගන්නා ලද කොන්ත්‍රාත්තු පිලිබඳ සඳහන් කිරීම.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (f) කොටසේ ප්‍රතිපාදනවලට අනුරූපව සමාගමේ පාලන ව්‍යුහය විසින්ඉදිරිපත් කර ඇති සාමාන්‍ය හා විශේෂ විධිවිධාන වලට අමතරව සමාගම විසින් වෙනත් කිසිදු ලිඛිත නීතියක් සම්පාදනය නොකිරීම.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (g) කොටසේ ප්‍රතිපාදන අනුව සමාගම් එහි බලතල කාර්යයන් සහ වගකීම් අනුව කටයුතු නොකිරීම

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (h) කොටසේ ප්‍රතිපාදන අනුව අදාළ නීති සහ කාලරාමුවලට අනුගතව සමාගම ප්‍රසම්පාදනය නොකිරීම ආර්ථිකමය ලෙස ඵලදායී ලෙස සහ කාර්යක්ෂම ලෙස උපයෝජනය නොකිරීම

2.3 වෙනත් කරුණු

(a) ප්‍රසම්පාදන පටිපාටීන් අනුගමනය කිරීමෙන් තොරව පුහුණු වැඩසටහන් සඳහා සැපයුම්කරුවකුගෙන් ආහාර පාන සැපයීමේ සේවාව ලබාගෙන ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ ඒ වෙත රු 615,540 ක් ගෙවා නිබිණිග පකසේ වෙනත් මේ සම්බන්ධයෙන් විගණනය වෙත කිසිදු ගිවිසුමක් ඉදිරිපත් කර නොතිබිණි.

(b) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබිණි.

ඩබ්. පී . සී. වික්‍රමරත්න
විගණකාධිපති

State Owned Institute Under
Ministry of Public Administration

DLC
Distance Learning Centre Ltd.
Connecting Minds

විගණනය කළ මූල්‍ය ප්‍රකාශය

2020

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන	2020	2019
		රු:	රු:
ආදායම	**04.**	**16,262,903**	64,674,064
වියදුම් පිරිවැය	**05.**	**(3,001,550)**	(23,138,534)
දළ ලාභය		**13,261,353**	41,535,530
වෙනත් ආදායම්	**06.**	**-**	84,750
බෙදාහැරීමේ වියදම්	**07.**	**(146,218)**	(2,971,237)
පරිපාලන වියදම්	**08.**	**(24,782,118)**	(31,449,422)
ශුද්ධ මූල්‍ය ආදායම	**09.**	**7,867,574**	8,512,218
ආදායම් බදුවලට පෙර ලාභය/(පාඩුව)		**(3,799,409)**	15,711,838
ආදායම් බදු ඉතුරුම්/ ගෙවීම	**10.**	**(566,930)**	2,064,086
වසරේ ලාභය/ (අලාභය)		**(4,366,340)**	17,775,925
කොටසකට ඉපයුම	**11.**	**(0.31)**	1.25

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.

වරහන් තුළ ඇති අගයන් මගින් දැක්වෙනුයේ අඩු කිරීමය.

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශනය

As At		**31.12.2020**	**31.12.2019 (නැවත ප්‍රකාශ කර ඇත)**
	සටහන	රු:	රු:
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**12**	**2,989,058**	4,369,926
මූල්‍ය ආයෝජන	**13**	**27,141,741**	27,141,741
බදු කුලිය	**14**	**19,860,703**	21,515,762
විලම්බිත බදු වත්කම්	**15**	**6,514,552**	7,081,483
මුළු ජංගම නොවන වත්කම්		**56,506,055**	60,108,911
ජංගම වත්කම්			
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	**16**	**6,685,335**	10,514,965
වෙනත් මූල්‍ය වත්කම්	**13**	**51,147,951**	41,844,050
අයකරගත යුතු ජංගම බදු	**17**	**4,620,751**	4,620,751
මුදල් හා මුදල් සමාන දෑ	**18**	**16,313,620**	22,305,796
මුළු ජංගම වත්කම්		**78,767,656**	79,285,562
මුළු වත්කම්		**135,273,711**	139,394,473
ස්කන්ධ සහ බැරකම්			
ස්කන්ධ			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**19**	**142,065,090**	142,065,090
සමුච්චිත ලාභය/(අලාභය)		**(14,206,542)**	(9,840,203)
මුළු ස්කන්ධ		**127,858,548**	132,224,887
ජංගම නොවන බැරකම්			
සේවක ප්‍රතිලාභ	**20**	**3,437,645**	3,044,695
මුළු ජංගම නොවන බැරකම්		**3,437,645**	3,044,695
ජංගම වගකීම්			
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	**21**	**3,410,328**	4,112,891
ලැබුණු අත්තිකාරම්	**22**	**567,190**	12,000
මුළු ජංගම බැරකම්		**3,977,518**	4,124,891
මුළු ස්කන්ධ සහ බැරකම්		**135,273,711**	139,394,473

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත.

.....	.....
මූල්‍ය කළමනාකරු	ප්‍රධාන විධායක නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ.
ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබා ඇත.

.....	.....	.....
සභාපති	අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.
වරහන් තුළ ඇති අගයන් මගින් දැක්වෙනුයේ අඩු කිරීමය.

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වන ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධන රු:	සමුච්චිත ලාභය/(අලාභය) රු:	එකතුව ස්කන්ධ
2019 ජනවාරි 1 වන දිනට ශේෂය	142,065,090	(27,720,527)	114,344,563
පූර්ව වසර ගැලපුම්	-	104,400	104,400
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම්	-	17,775,925	17,775,925
2019 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**142,065,090**	**(9,840,203)**	**132,224,887**
2020 ජනවාරි 1 වන දිනට ශේෂය	**142,065,090**	**(9,840,203)**	**132,224,887**
පූර්ව වසර ගැලපුම්	-	-	-
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම්	-	**(4,366,340)**	**(4,366,340)**
2020 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**142,065,090**	**(14,206,542)**	**127,858,548**

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.
වරහන් තුළ ඇති අගයන් මගින් දැක්වෙනුයේ අඩු කිරීමය.

සටහන අ- පූර්ව වසර ගැලපුම්	රු:
2019 අතිවාරිත විගණන ගාස්තුව	**104,400.00**
	104,400.00

පූර්ව වසර ගැලපුම් හේතුවෙන් 2019 බදුවලට පෙර ලාභය වැඩි වී ඇත. එබැවින්, 2019 බදුවලට පෙර ලාභය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ නැවත ප්‍රකාශ කර ඇත.

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ **07**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2020 දෙසැම්බර් **31** න් අවසන් වූ වර්ෂය සඳහා

	2020.	**2019.** (නැවත ප්‍රකාශ කර ඇත)
	රු:	රු:
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
ආදායම් බදුවලට පෙර ලාභය/(පාඩුව) වියදම්	**(3,799,409)**	15,816,238
ගැලපුම්		
දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම	**1,528,867**	1,825,576
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**392,950**	386,700
බදු කුලී ක්‍රමක්ෂය	**1,655,059**	1,655,059
මූල්‍ය පිරිවැය	**-**	24,046
පොලී ආදායම	**(7,907,263)**	(8,629,723)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**(8,129,796)**	11,077,896
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑවල (වැඩිවීම්)/අඩුවීම්	**3,829,630**	(1,283,147)
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑවල (වැඩිවීම්)/අඩුවීම්	**(702,562)**	348,003
ලැබුණු අත්තිකාරම් (වැඩිවීම්)/අඩුවීම්	**555,190**	(3,110,110)
	(4,447,538)	7,032,642
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්		
ගෙවූ ආර්ථික සේවා බාස්තු	**-**	(265,450)
රජයේ ණය සඳහා ගෙවූ පොළිය	**-**	(24,046)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ (භාවිතා කළ) ශුද්ධ මුදල්	**(4,447,538)**	6,743,146
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම්	**(148,000)**	(4,821,950)
ස්ථාවර තැන්පතු ආපසු ගැනීම්	**-**	4,800,974
ලැබූ පොළිය	**(1,396,638)**	3,324,247
ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්	**(1,544,638)**	3,303,271
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
වසර තුළ නැවත ගෙවූ ණය	**-**	(3,206,160)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්	**-**	(3,206,160)
මුදල් සහ මුදලට සමාන දේවල ශුද්ධ වැඩි වීම	**(5,992,176)**	6,840,256
වසර ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	**22,305,796**	15,465,540
වසර අවසානයේ මුදල් සහ මුදල් සමානදෑ (සටහන අ)	**16,313,620**	22,305,796

සටහන අ- මුදල් හා මුදල් සමාන දෑ	**31.12.2020**	31.12.2019
	දිනට	දිනට
	රු:	රු:
බැංකුවල මුදල් - ලංකා බැංකුව: ගිණුම් අංක. 0002323189	**916,622**	160,784
අතැති මුදල්	**25,000**	25,000
අරමුදල් කළමනාකරණ ගිණුම	**15,371,997**	22,120,012
	16,313,620	22,305,796

මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් වෙයි.

වර්ෂාන් තුළ ඇති අගයන් මගින් දැක්වෙනුයේ අඩු කිරීමය.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020

1. වාර්තාකරන අස්තිත්වය

සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත මෙන්ම එහි නිත්‍ය වාසය කොටගත් රජයේ සීමිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07 ලිපිනයෙහි පිහිටා තිබේ.

ගෝලීය දුරස්ථ ඉගෙනුම් ජාලය භාවිතා කොට විශේෂයෙන්ම රාජ්‍ය කළමනාකරණය සහ ආර්ථික සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර මට්ටමේ විශේෂඥයින් සමග අන්තර් ක්‍රියාකාරීත්වය ඇතිකරගැනීම සඳහා යාවත්කාලීන තොරතුරු සහ අවස්ථාවන් වෙත ප්‍රවේශය ලබාගැනීමට රාජ්‍ය හා පොද්ගලික අංශ සේවකයින් සඳහා පහසුකම් ලබාදීම වෙනුවෙන් වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු සහ අනෙකුත් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ පැවැත්වීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වේ.

2. සකස් කිරීම සඳහා පදනම

2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලව හා 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුව සකස් කරන ලද විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, සම කොටස්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සහ වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති යනාදිය සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත වේ.

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලව සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන.

2.2 මැනුම් සඳහා පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පදනම්ව සකස් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම් ඇති කෙරෙන උද්ධමන සාධක සඳහා ගැළපුම් රහිතව ගිණුම්කරන ප්‍රතිපත්ති සංගත ලෙස යොදාගනු ලැබේ.
පූර්වේක්ෂ්‍ය අනාගතයේදී ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සමාගම් සතු හැකියාව පිළිබඳ ඇගයීමක් අධ්‍යක්ෂකවරුන් විසින් සිදු කොට ඇති අතර එයට අනුව ක්‍රියාකාරකම් ඇවරකිරීම හෝ අවසන් කිරීම සඳහා අවශ්‍යතාවක් මවුන් දකින්නේ නැත.

2.3 කාර්යබද්ධ සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ කාර්යබද්ධ ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේදී , ගිණුම්කරන ප්‍රතිපත්ති යොදාගැනීම සහ වත්කම්, බැරකම්, ආදායම් හා වියදම්වල වාර්තාගත ප්‍රමාණයන් කෙරෙහි බලපානු ලබන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරිත්වයට සිදුවේ.

ඉතිහාසය පිළිබඳ අත්දැකීම් සහ ඒ ඒ වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ඇතුළු අනෙකුත් සාධක මත පදනම්ව විනිශ්චයන් සහ ඇස්තමේන්තු සිදු කෙරේ. එබැවින් සත්‍ය ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වන උපකල්පන අඛණ්ඩව සිදු කෙරෙන පදනමින් සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කෙරෙන කාලසීමාව තුළදී සහ බලපෑමට ලක්වන ඕනෑම ඉදිරි කාලසීමාවන් තුළදී හඳුනාගැනේ.

3. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරන ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර තිබෙන සියලු කාල පරිච්ඡේද සඳහා සංගත ලෙස යොදා ගෙන ඇත. එහි අරමුණ වනුයේ, නිශ්චිත වශයෙන් දක්වා ඇති අවස්ථාවන් හැර කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති වෙත පරිවර්තනය කිරීම සඳහාය.
අස්තිත්වය විසින් ගිණුම්කරන ප්‍රතිපත්ති සංගත ලෙස යොදා ගෙන ඇත.

3.1 විදේශ මුදල් ගණුදෙනු

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, අස්තිත්වයේ කාර්යබද්ධ ව්‍යවහාර මුදල් හැර අනෙකුත් ව්‍යවහාර මුදල්වලින් (විදේශ මුදල්) සිදුකෙරෙන ගණුදෙනු, එම ගණුදෙනු සිදුකෙරෙන දිනවලදී පවතින විනිමය අනුපාතික භාවිතා කොට කාර්යබද්ධ ව්‍යවහාර මුදලින් වාර්තා කෙරේ.

සෑම වාර්තාකරන දිනයකදීම, විදේශ මුදල්වලින් ඉදිරිපත් කෙරෙන මූල්‍ය අයිතම පියවුම් අනුපාතිකයට අනුව පරිවර්තනය කෙරේ. සාධාරණ වටිනාකමට අනුව මිනුම් කරන ලද මූල්‍යමය නොවන අයිතම, සාධාරණ වටිනාකම නිර්ණය කරන ලද දිනයේ පවතින අනුපාතිකවලට අනුව පරිවර්තනය කෙරේ. ඓතිහාසික පිරිවැය අනුව මිනුම් කරන ලද මූල්‍යමය නොවන අයිතම ගණුදෙනු සිදු කෙරෙන දිනවල පවතින අනුපාතිකවලට අනුව පරිවර්තනය කෙරේ.

මූල්‍ය අයිතම තෙරුම් කිරීම් සහ මූල්‍ය අයිතම පරිවර්තනය මත පැන නගින විනිමය අන්තරය, කාල පරිච්ඡේදය සඳහා වන ලාභ හෝ පාඩු තුළ අන්තර්ගත කෙරේ.

සාධාරණ වටිනාකම් දරන මූල්‍යමය නොවන අයිතම පරිවර්තනය මත පැන නගින විනිමය අන්තරයන් කාල පරිච්ඡේදය සඳහා වන ලාභ හෝ පාඩු තුළ අන්තර්ගත කෙරෙන අතර අනෙකුත් විස්තීරණ ආදායම තුළ හඳුනාගැනෙන අන්තරයන් මෙහිදී බැහැර කෙරේ.

3.2 වත්කම් සහ ඒවායේ තක්සේරුව සඳහා පදනම් වන කරුණු

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය තුළ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද වත්කම් යනු මුදල්, බැංකු ශේෂ සහ සමාගමේ හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය අතරතුර හෝ වාර්තාකරන දින සිට වසරක් ඇතුළත හෝ යන දෙකෙන් කෙටි කාලය තුළ මුදලින් උපලබ්ධි කිරීමට අපේක්ෂා කෙරෙන දෑ වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ වාර්තාකරන දින සිට වසරක කාලයකට එහා සමාගම විසින් තබා ගැනීමට අදහස් කරනු ලබන දෑ වේ.

3.2.1 දේපළ, පිරියත හා උපකරණ

3.2.1.1 හඳුනාගැනීම හා මිනුම් කිරීම

දේපළ, පිරියත හා උපකරණ, පිරිවැය අඩු කරන ලද සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානි අලාභ වලදී ප්‍රකාශ කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක තිබෙන කොටස් විවිධ ආයු කාලවලින් ප්‍රයෝජනයට ගත හැකි වන්නේ නම්, ඒවා දේපළ, පිරියත සහ උපකරණ වෙන වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගැනේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් නිශ්කාෂණය කිරීමෙන් වන ලාභ හා පාඩු, නිශ්කාෂණය කිරීමෙන් ලැබෙන මුදල්, දේපළ, පිරියත හා උපකරණවල ධාරණ ප්‍රමාණය සමග සන්සන්දනය කිරීමෙන් තීරණය කෙරෙන අතර අනෙකුත් ආදායම තුළ ලාභ හෝ පාඩු වල ශුද්ධ අගයක් ලෙස හඳුනාගැනේ.

3.2.1.2 ක්ෂය

වත්කමක පිරිවැය හෝ පිරිවැය සඳහා ආදේශ කරන අනෙක් ප්‍රමාණය (එහි අවශිෂ්ට වටිනාකම රහිතව) වන ක්ෂය විය හැකි ප්‍රමාණය මත ක්ෂය ගණනය කෙරේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයක ඒ ඒ කොටසේ ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලයන් මත සරල රේඛීය පදනමකින් ක්ෂයවීම් ලාභ හෝ පාඩු තුළ හඳුනාගැනේ. ඒ, මෙය, වත්කම තුළ ගැබ්ව පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂිත රටාව ඉතා සමීපව පිළිබිඹු කරන බැවිනි.

වත්මන් සහ සාපේක්ෂ කාල පරිච්ඡේදය සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලයන් පහත පරිදි වේ.

වත්කම් කාණ්ඩය	ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය (වසර)	ක්ෂයවීමේ ශිෂ්‍යතාව (%)
පරතරයන් අවම කිරීමේ හා ඉගැන්වීමේ උපකරණ	5	20
පරිගනක උපකරණ	4	25
මෝටර් රථ	5	20
කාර්යාල උපකරණ	5	20
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	5	20

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය භාවිතයට ගැනීමට ලැබෙන අවස්ථාවේදී වන අතර වත්කමක ක්ෂයවීම නතර වනුයේ වත්කම, අලෙවිය සඳහා රඳවාගත් යනුවෙන් වර්ගීකරණය වන දිනය සහ වත්කම වත්කමක් ලෙස හඳුනා නොගැනෙන දිනය යන දෙකෙන් කලින් එලැබෙන දිනයේ වේ.

ක්ෂයවීමේ ක්‍රමය, ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය සහ අවශිෂ්ට වටිනාකම සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කෙරෙන අතර සුදුසු නම්, ගැලපුම් කෙරේ.

3.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරෙන වගකීම් යනු, ඉල්ලූ විට හෝ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරක් ඇතුළත හෝ ගෙවිය යුතු වන ගෙවීම්ය. ජංගම නොවන වගකීම් යනු, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වන ශේෂයන් වේ. හඳුනාගත් සියලු වගකීම් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගණන් ගැනී ඇත.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන්, විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතුව වර්තමානයේ පවතී නම් සහ එම බැඳීම තෙරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා යෑමක් අවශ්‍ය විය හැකි වන්නේ නම් එහිදී ප්‍රතිපාදනයක් හඳුනාගැනේ.

3.3.1 සේවක ප්‍රතිලාභ

3.3.1.1 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත්-සේවක ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ යම් අස්තිත්වයක් විසින් වෙනම අස්තිත්වයක් වෙත ස්ථාවර දායකත්ව මුදලක් ගෙවනු ලබන අතර ඉන් ඉදිරියට වෙනත් කිසිදු මුදලක් ගෙවීමට නෛතික හෝ සම්මුතික බැඳීමක් එම අස්තිත්වයට ඇත්තේ නැත. නිශ්චිත දායකත්ව විශ්‍රාම වැටුප් සැලසුම් වෙත දායක වීම සඳහා වන බැඳීම්, සේවකයින් විසින් සේවාවන් සපයනු ලබන කාල සීමාවන් තුළදී සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස ලාභ හෝ පාඩු තුළ හඳුනාගැනේ.

සේවකයින්ගේ දළ පඩිනඩි වලින් 12%ක් සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදල වෙත දායක කෙරේ.

සියලුම සේවකයින් සේවක භාර අරමුදල සඳහා සුදුසුකම් ලබන අතර එම සේවකයින්ගේ දළ පඩිනඩිවලින් 3%ක් සමාගම විසින් එම අරමුදලට දායක කෙරේ.

3.3.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලැස්මකට පරිබාහිර වූ පශ්චාත්-සේවක ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යටතේ, වත්මන් සහ පෙර සිටි සේවකයින් වෙත ගිවිසි ප්‍රතිලාභය ලබාදීමට අස්තිත්වය බැඳී සිටී.

වත්මන් සේවකයින් විසින් අනාගතයේ කරනු ලබන සේවාවන් නොසලකා හැරීම, ඇස්තමේන්තු කරන ලද අනාගත වැටුප් වැඩිවීම් නොසලකා හැරීම සහ වාර්තා කරන දිනය සහ සේවකයින් පශ්චාත් සේවක ප්‍රතිලාභ ලැබීම ඇරඹීමට අපේක්ෂිත දිනය අතර වත්මන් සේවකයින් සේවයේ යෙදී සිටියදී සිදුවිය හැකි මර්තව්‍යතාව නොසලකා හැරීම යනාදී වශයෙන් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති- "සේවක ප්‍රතිලාභ" හි 28 වන වගන්තිය මගින් අවසර ලබා දී ඇති සරලකිරීම් භාවිතා කොට සේවය අරඹන දිනයේ සිට සේවය කරන සෑම වසරක් සඳහාම ආයුගණක තක්සේරුකරණය රහිතව අඩ මසක වැටුපට, නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම සඳහා සමාගමේ ශුද්ධ බැඳීම ගණනය කෙරේ.

කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති - "සේවක ප්‍රතිලාභ" හි 28 වන වගන්තියට අනුකූලව සියලු සේවකයින් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික සඳහා විධිවිධාන සලසා ඇත. කෙසේවුවද, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවකයෙකු

වෙත පාරිතෝෂිකය ගෙවීම සඳහා වන බැඳීම මතු වනුයේ සේවකයා විසින් වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළහොත් පමණක් වන අතර සේවක සංඛ්‍යාව 15 ට වඩා අඩු නම්, එවැනි සේවකයින් සඳහා පාරිතෝෂිකය ගෙවීම විධානාත්මක නොවේ. බැඳීම බාහිරව අරමුදල් සැපයෙන්නකි.

3.3.2 ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිතභාවන්

අවිනිශ්චිතභාවන් යනු පසුගිය සිදුවීමක් හේතුවෙන් ඇති වූ දේපළ හෝ බැඳීම් විය හැකි අතර ඒවා නහවුරු වන්නේ සමාගමේ පාලනයෙන් බැහැර වූ අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇති වීම හෝ ඇති නොවීම මත පමණි.

3.3.2.1 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා වියදම් ක්‍රමයේ ක්‍රියාකාරීත්වය මගින් සමාගමේ කාර්යසාධනයෙහි ලක්ෂණ සාධාරණව ඉදිරිපත් කරන බැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් සුළු හා මධ්‍යම පරිමාන ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි 3 කොටසෙහි ප්‍රතිපාදනවලට එනම් "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" අනුව යොදා ගැනෙන බවයි.

3.4.1 ආදායම් හඳුනාගැනීම

සමාගම වෙත ආර්ථික වාසි ලැබෙන ලෙස සහ ආදායම හා දැනටමත් දරා ඇති හෝ දැරීමට නියමිත ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැන ගැනීමට හැකි වන ලෙස ආදායම් හඳුනා ගැනේ. සංශෝධිත හෝ සංශෝධනය කළ හැකි ගෙවීම්හි සාධාරණ අගය, ඉද්ධ වෙළඳ වට්ටම් හා ආදායමට අදාළ බදු අනුව ආදායම මැන බලනු ලැබේ. ආදායම් හඳුනා ගැනීම සඳහා පහත දැක්වෙන නිශ්චිත වූ නිර්ණායක යොදා ගනු ලැබේ.

3.4.1.1 සේවාවන් සැපයීම

සේවාවන් සැපයීමට අදාළ ගණුදෙනු තුළින් ලැබෙන ආදායම් වාර්තා කිරීමේ කාලය අවසානයේ ගණුදෙනුව සම්පූර්ණ කිරීමේ අදියරට අදාළව හඳුනා ගනු ලබයි. නිශ්චිත කාල සීමාවක් තුළ අනියත වාර ගණනක් සේවාවන් සැපයූ විට සමාගම විසින් නිශ්චිත වූ කාල සීමාව තුළ සෘජු රේඛීය පදනමක් මත ආදායම් හඳුනා ගනු ලබන අතර නිශ්චිත වූ කටයුත්තක් වෙනත් කටයුත්තකට වඩා වැදගත් වන විට වැදගත් කටයුත්ත සිදු කරන තුරු සමාගම විසින් ආදායම් හඳුනා ගැනීම් කල් දමනු ලැබේ.

3.4.1.2 පොළී ආදායම්

රැස් කර ගැනීම් පිළිබඳ සැකයක් නොමැත්තේ නම් පොළී ආදායම් ලද පොළිය (වත්කම්වලින් ලද ඵලදායී ආදායම් සැලකිල්ලට ගෙන) ලෙස හඳුනා ගනු ලැබේ.

3.4.1.3 වෙනත් ආදායම්

අනෙකුත් සියළු ආදායම් උපචිත පදනම් මත හඳුනා ගනු ලැබේ.

3.4.2 වියදම් හඳුනා ගැනීම

3.4.2.1 මෙහෙයුම් වියදම්

ව්‍යාපාරයේ දෛනික මෙහෙයුම් කටයුතු සිදු කිරීමෙදී දී හා දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීමේදී දැරීමට සිදු වන වියදම් වසරට අදාළ ලාභය/ (පාඩුව) ගණනය කිරීමේ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කර ඇත. වෙළඳ ලැබීම් අඩුවීම, ප්‍රකාශිත බැරකම් හා දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම් අඩුවීම් සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

3.4.2.2 මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය රාජ්‍ය ණය හා බැංකු අයිරාවලට අදාළ පොළී වියදම්වලින් සමන්විත වේ. ලාභයට හා අලාභයට අදාළව සියළු ණය පිරිවැය සරල පොළී ක්‍රමය භාවිතා කර හඳුනා ගැනේ.

3.4.2.2 බදු වියදම්

ආදායම් බදු වියදම් ජංගම හා විලම්බිත බදුවලින් සමන්විත වේ. සමාගමට අයත් වූ හඳුනාගෙන ඇති අයිතම හැර ආදායම් බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති අතර එවැනි අවස්ථාවල ඒවා සමාගම් තුළ හඳුනා ගැනේ.

3.4.2.3.1ජංගම බදු

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත හා පසුව සම්මත කර ගන්නා ලද පනත් මගින් සංශෝධනය කරන ලද හෝ වාර්තා කරනු ලබන දිනය වන විට නීත්‍ය ලෙස පනවන ලද නීතිවලට අදාළ ප්‍රතිපාදන අනුව ඇගයීමට ලක් කරන ලද වසර සඳහා ගණනය කරන ලද බදු පැනවිය හැකි ආදායම මත දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවන ලද හෝ ගෙවීමට අපේක්ෂිත මුදල අනුව වර්තමාන හා සන්සන්දනාත්මක කාල සීමාවන් සඳහා ජංගම බදු වියදම් ගණනය කරනු ලැබේ.

3.4.2.3.2 විලම්බිත බදු පැනවීම

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සඳහා ඉදිරියට ගෙන යන වත්කම් හා බැරකම් ප්‍රමාණය සහ ඉදිරියේ දී ආපසු හැරවීමට අපේක්ෂිත පරිදි බදු පැනවීම් සඳහා යොදා ගැනෙන ප්‍රමාණයන් අතර වන තාවකාලික වෙනස්කම්වලට අදාළව ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය භාවිතා කර විලම්බිත බදු පැනවීම් හඳුනා ගැනේ.

වාර්තා කරනු ලබන දින වන විට පනවන ලද හෝ නීත්‍ය ලෙස පනවන ලද නීති මත පදනම්ව ආපසු හරින ලද තාවකාලික බදු වෙනසට අදාළ කර ගැනීමට අපේක්ෂිත බදු අනුපාතයන් අනුව විලම්බිත බදු ගණනය කෙරේ.

ඉදිරියේ දී බදු පැනවිය හැකි ලාභයක් ඇති විය හැකි වන පරිදි දැනට ඉහිරී බදු අලාභ, බදු බැර හා අඩු කළ හැකි තාවකාලික බදු වෙනස සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ. විලම්බිත බදු සෑම වාර්තා කරනු ලබන දිනයක දී ම සමාලෝචනය කෙරෙන අතර තවදුරටත් අදාළ බදු ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වන ප්‍රමාණයට අඩු කෙරේ.

ජංගම බදු බැරකම්වලට එරෙහිව ජංගම බදු වත්කම් හිලව් කිරීම සඳහා නෛතිකව ක්‍රියාත්මක කළ හැකි හිමිකමක් ඇත්නම් සහ විලම්බිත බදු එකම බදු පැනවිය හැකි අස්තිත්වය හා එකම බදු පැනවීමේ අධිකාරයට සම්බන්ධ නම් විලම්බිත බදු වත්කම් හා විලම්බිත බදු බැරකම් හිලව් කරනු ලැබේ.

3.5 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

"මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය සකස් කරන ලද්දේ "වක්‍ර ක්‍රමය" භාවිතා කොටගෙනය. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා ගෙවන ලද පොළිය මෙහෙයුම් මූල්‍ය ප්‍රවාහ ලෙස ද ලද පොළිය ආයෝජන මූල්‍ය ප්‍රවාහ ලෙස ද වර්ග කෙරේ.

3.6 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ගාස්තුවක් අය කරන්නේ ද නැතිද යන්න පිළිබඳ නොසලකා එක් පාර්ශවයකට අනෙක් පාර්ශවයේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති/ තීරණ පාලනය කිරීම හෝ ඒවා කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කිරීමට හැකියාව ඇති ගණුදෙනු පිළිබඳ හෙළිදරව් කරන ලදී.

3.7 කොටසක ඉපැයීම්

සමාගම විසින් එහි සාමාන්‍ය කොටස් සඳහා කොටසක මූලික ඉපැයීම් (ඌපී) දත්ත ඉදිරිපත් කරනු ලැබේ. කොටසක මූලික ඉපැයීම් ගණනය කරනු ලබන්නේ සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ ලාභය හෝ අලාභය අදාළ කාල සීමාව තුළ සාමාන්‍ය කොටස්හි බර තැබූ සාමාන්‍යයෙන් බෙදීම මගිනි.

3.8 වාර්තා කරනු ලබන කාල සීමාවෙන් පසුව සිදු වූ සිදුවීම්

වාර්තා කරන කරනු ලබන කාල සීමාව අවසානය හා නිකුත් කිරීම සඳහා අවසර ලද මූල්‍ය ප්‍රකාශනවල දිනය අතර කාලය තුළ සිදු වූ යහපත් හා අයහපත් සිදුවීම් වාර්තා කරනු ලබන කාල සීමාවට පසුව සිදු වූ සිදුවීම් වේ. වාර්තා කරනු ලබන කාල සීමාවට පසුව සිදු වූ සිදුවීම්වල භෞතික ප්‍රතිඵල පිළිබඳ සැලකිල්ලට ගෙන අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශයන්ට යෝග්‍ය වෙනස්කම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2020

සටහන 04 - ආදායම්

	2020.	2019.
	රු:	රු:
පරිගණක පදනම් පුහුණු පහසුකම්	**1,467,672**	13,954,595
මුහුණට මුහුණ පුහුණු පහසුකම්	**910,000**	23,073,128
වීඩියෝ සංවාද පහසුකම්	**803,275**	291,500
මුහුණට මුහුණ කුලී පහසුකම්	**185,200**	3,736,040
පරිගණක පදනම් කුලී පහසුකම්	**358,490**	2,369,782
ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ	**2,096,500**	3,234,056
මාර්ගගත විභාග	**10,441,766**	16,031,776
ජාත්‍යන්තර වැඩසටහන්	**-**	1,983,188
	16,262,903	64,674,064

සටහන 05 - විකුණුම් පිරිවැය

	රු:	රු:
මුළු අරමුදල් පිරිවැය	**3,001,550**	23,138,534
	3,001,550	23,138,534

සටහන 06- වෙනත් ආදායම්

	රු:	රු:
විවිධ ආදායම්	**-**	84,750
	-	84,750

සටහන 07- බෙදාහැරීමේ වියදම්

	රු:	රු:
අලෙවි ප්‍රවර්ධන පිරිවැය	**69,328**	31,675
TBSI *- අලෙවි කළමනාකරු	**-**	1,980,461
TBSI -ප්‍රධාන විධායක නිලධාරි	**-**	605,000
ඩොකට්ටු මුද්‍රණය	**-**	184,000
සටහන් පොත් මුද්‍රණය	**-**	170,101
ගමන් වියදම් - විභාග මධ්‍යස්ථාන වෙත සංචාර	**76,890**	-
	146,218	2,971,237

* TBSI – ඉලක්ක පදනම් විකුණුම් දිරි දීමනා

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2020

සටහන 08- පරිපාලන වියදම්	**2020.**	**2019.**
	රු:	රු:
වැටුප්	**11,229,888**	11,177,257
කළමනාකරුවන් සඳහා වාර්ෂික වැටුප් වැඩි කිරීම සඳහා ප්‍රතිපාදන (සටහන 8.1)	**470,000**	110,000
සේඅඅ වියදම්	**1,347,587**	1,340,971
සේනිහාඅ වියදම්	**336,897**	335,243
අතිකාල වියදම්	**169,650**	632,539
දිරිදීමනා වියදම් / TBSI ගෙවීම	**-**	976,843
පුහුණු සහ සංවර්ධන ගාස්තු	**2,000**	19,000
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**392,950**	386,700
කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ වියදම්	**-**	50,787
2019/03 අනුව කාර්ය මණ්ඩල ප්‍රතිපාදන සඳහා ප්‍රසාද දීමනා (සටහන 8.2)	**-**	148,500
විශේෂ ගෙවීම් ශේෂය / මණ්ඩලය විසින් අනුමත කරන ලද සූත්‍රය අනුව කාර්ය මණ්ඩල ප්‍රතිපාදන සඳහා ප්‍රසාද දීමනා	**-**	316,500
මණ්ඩල රැස්වීම් සහ විගණන කමිටුව රැස්වීම් සඳහා සහභාගි වීමේ ගාස්තු	**-**	650,000
මණ්ඩල රැස්වීම් සහ විගණන රැස්වීම් සඳහා තේපැන්	**-**	103,075
පරිපාලන සහකරුවන්ට නිල ඇඳුම් පිරිවැය	**30,820**	27,465
දුරකථන	**235,606**	280,375
විදුලි වියදම්	**2,778,568**	4,640,541
අන්තර්ජාල ගාස්තු	**182,056**	159,862
ඊමේල් සැකසීමේ ගාස්තුව	**117,677**	93,280
ගමන් වියදම්	**32,145**	63,373
ඉන්ධන - සමාගමේ යතුරු පැදිය	**17,000**	30,220
ප්‍රධාන විධායක නිලධාරි සඳහා ඉන්ධන දීමනා	**306,000**	306,000
ප්‍රධාන විධායක නිලධාරි සඳහා වාහන දීමනා	**600,000**	600,000
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය පිරිවැය	**61,550**	206,702
පුවත්පත් සහ සඟරා වියදම්	**29,590**	38,660
උපකරණ නඩත්තුව	**499,569**	636,724
ගොඩනැගිලි නඩත්තු කටයුතු	**159,942**	201,242
සෝපාන නඩත්තු කිරීමේ ගාස්තු	**394,060**	400,000
යතුරු පැදිය නඩත්තුව	**18,415**	14,950
සෞඛ්‍ය රක්ෂණය	**387,205**	413,651
යතුරු පැදි රක්ෂණය	**11,265**	13,637
ගිනි රක්ෂණය	**62,621**	68,328
ක්ෂය වීම්	**1,528,867**	1,825,576
බදු කුලි ක්‍රමක්ෂය	**1,655,059**	1,655,059
පිරිසිදු කිරීමේ ගාස්තු	**743,771**	743,892

විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන (සටහන 8.4)	**200,000**	450,000
වෘත්තීය ගාස්තු	**-**	50,000
ලේකම් ගාස්තු	**116,409**	364,516
බැංකු ගාස්තු	**11,797**	22,525
කාර්ය මණ්ඩලය සඳහා තේ වියදම්	**69,563**	71,816
වාර්ෂික වාර්තාව පරිවර්තනය සහ සැකසීමේ ගාස්තු	**55,000**	55,885
ශ්‍රාය පිටපත් යන්ත්‍ර කුලිය	**80,788**	451,334
සභාපති දීමනා	**-**	146,250
වාර්ෂික වාර්තා මුද්‍රණ වියදම්	**-**	156,611
දණ්ඩන ගාස්තු	**-**	3,700
DLC වෙබ් සත්කාරක ගාස්තු	**7,200**	21,024
ප්‍රක්ෂේපණ ආලෝක පහන් මිලදී ගැනීම	**-**	92,000
මේස අලුත්වැඩියා කිරීමේ වියදම්	**-**	244,282
VC කාමරය කාපට් ඇතිරීමේ වියදම්	**-**	652,529
වතුර බෝතල්	**16,480**	-
සුළු අලුත්වැඩියා	**74,130**	-
සෞඛ්‍ය සහ සුරක්ෂිතතා නඩත්තු පිරිවැය	**160,826**	-
කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාල දීමනා	**27,000**	-
සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට වාර්ෂික ලියාපදිංචි බද්ද	**150,000**	-
රැස්වීම් සංග්‍රහ	**12,170**	-
	24,782,118	31,449,422

සටහන 8.1 මණ්ඩලය නොසිටි බැවින් කළමනාකරුවන් සඳහා වාර්ෂික වැටුප් වර්ධක 2019 සිට ගෙවා නොමැත. එබැවින් වාර්ෂික වැටුප් වර්ධකයක් ලෙස රු.470,000/- ක් ලබා දෙන ලදී. මෙය ගණනය කර ඇත්තේ වසරකට අනුමත වැටුප් වර්ධක මත පදනම්වය.

සටහන 8.2 මෙහෙයුම් ලාභයේ උපරිමය මිලියන 10ක් වන ප්‍රසාද දීමනා ගෙවීමේ සීමාවක් සහිත මෙහෙයුම් ලාභ මත පදනම්ව 2017 වසරේ විශේෂ ප්‍රසාද දීමනා සූත්‍රයක් මණ්ඩලය විසින් අනුමත කර ඇත. ඉහත ප්‍රසාද දීමනා සූත්‍රය එකඟතාව සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. 2017 සිට 2019 දක්වා DLC විසින් එක් සේවකයෙකුට රු. 13,500/- බැගින් පමණක් ගෙවා තිබූ අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගන්නා තෙක් ශේෂ මුදල ප්‍රතිපාදනයක් ලෙස රඳවා ගැණිනි.

2019 වසර සඳහා ප්‍රසාද දීමනා/විශේෂ ගෙවීම් ගණනය 2019

2019 සඳහා මණ්ඩලය අනුමත සූත්‍රය අනුව මෙහෙයුම් ලාභය මිලියන 6ක් සඳහා විශේෂ ගෙවීම	**465,000**
3/2019 චක්‍රලේඛය අනුව ප්‍රසාද දීමනා (සටහන 8.2)	**(148,500)**
මණ්ඩලය අනුමත සූත්‍රය යටතේ ශේෂ ප්‍රතිපාදන (සටහන 8.3)	**316,500**

සටහන 8.4- විගණන ගාස්තු

විගණකාධිපති සඳහා බාහිර විගණන ගාස්තු	**200,000**
	200,000

සටහන **09** - ශුද්ධ මූල්‍ය ආදායම

	රු:	රු:
මූල්‍ය ආදායම		
ස්ථාවර තැන්පතු පොළී ආදායම	**7,384,976**	8,050,524
අරමුදල් කළමනාකරණ ගිණුම් මත පොළිය	**522,286**	579,200
	7,907,263	8,629,723
අඩු කළා: මූල්‍ය පිරිවැය		
විනිමය අනුපාත වෙනස	**39,689**	93,459
රාජ්‍ය ණය පොළී	**-**	24,046
	39,689	117,506
	7,867,574	8,512,218

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2020

සටහන 10- ආදායම් බදු වියදම්

10.1- ප්‍රංශම බදු

පසුකාලීන සංශෝධන පනත් මඟින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව සමාගම අධ්‍යාපනික සේවා සැපයීමේ නියැලෙන ලාභ සහ ආදායම සඳහා 14% ක අනුපාතයකට වගකිව යුතු අතර අනෙකුත් ආදායම් ප්‍රභවයන් සඳහා 28% කට වගකිව යුතුය.

	2020.	2019.
	රු:	රු:
වත්මන් වසරේ ලාභයේ බදුකරණය (සටහන 10.2)	-	-
බදු සඳහා අඩි/(ණය) ප්‍රතිපාදන	-	(612,929)
වසර තුළ ප්‍රත්‍යාවර්තනය කළ/ (හඳුනාගත්) විලම්බිත බදු වත්කම්	**(566,931)**	2,677,015
	(566,931)	2,064,086

10.2 ගිණුම්කරණ ලාභය සහ බදු අය කළ හැකි ලාභය අතර සැසඳීම

ආදායම් බදු වියදම්වලට පෙර ගිණුම් ලාභය	**(3,799,409)**	15,711,838
ඉඩ නොදුන් අයිතම සාමාන්‍යය	**2,591,817**	3,292,176
ඉඩ දුන් අයිතම සාමාන්‍යය	**(1,156,465)**	(1,453,935)
පොලී ආදායම	**(7,907,263)**	(8,629,724)
ව්‍යාපාරයෙන් බදු අය කළ හැකි ලාභය/(අලාභය)	**(10,271,319)**	8,920,355
වසර තුළ උපයෝජිත බදු පාඩුව	**10,271,319**	(8,920,355)
බදු අය කළ හැකි ආදායම	-	-
ව්‍යාපාර ආදායම මත 14% ආදායම් බද්ද	-	-
ආයෝජන ආදායම මත 28% ආදායම් බද්ද	-	-
වත්මන් වසරේ ලාභය මත බදුකරණය	-	-

10.3 බදු පාඩුව සැසඳීම

ඉදිරියට ගෙන ආ බදු පාඩුව	**70,444,458**	87,994,537
වසර තුළ උපයෝජිත බදු පාඩුව		
ව්‍යාපාර ආදායමට අනුව අඩු කළ	-	(8,920,355)
ආයෝජන ආදායමට අනුව අඩු කළ	**(7,907,263)**	(8,629,724)
ඉදිරියට ගෙන ආ බදු පාඩුව	**62,537,195**	70,444,458

සටහන 11. සාමාන්‍ය කොටසකට ඉපයුම් /(පාඩුව)

කොටසකට ඉපැයීම් / (අලාභය) ගණනය කිරීම සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය / (අලාභය) මත පදනම්ව වසර අවසානයේ දී ඉතිරිව ඇති සාමාන්‍ය කොටස්වල බර කළ සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීම පහත පරිදි ගණනය කෙරේ.

	2020.	2019.
සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය / (පාඩුව)	**රු:**	රු:
බදු ගෙවීමෙන් පසු සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය	**(4,366,340)**	17,775,925
සාමාන්‍ය කොටස් ගණන		
වසර තුළ නිහ සාමාන්‍ය කොටස් ගණනේ බරතැබූ සාමාන්‍යය	**14,206,509**	14,206,509
කොටසකට ඉපයීම්/ (අලාභය) (රු)	**(0.31)**	1.25

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2020

සටහන 12- දේපළල පිරියත සහ උපකරණ

	සිත්නක්කර					
12.1 පිරිවැය	ගෘහ භාණ්ඩ සහ කාර්යාල සවි කිරීම්	උපකරණ	පරිගණක උපකරණ	වාහන	උපකරණ	එකතුව
	රු:	රු:	රු:	රු:	රු:	රු:
2020 ජනවාරි 1 වන දිනට ශේෂය	4,686,634	3,113,078	45,415,384	152,040	6,104,142	59,471,277
වසර තුළ එකතු කිරීම්	-	126,500	21,500	-	-	148,000
වසර තුළ බැහැර කිරීම් / (මාරු කිරීම්)	-	-	-	-	-	-
2020 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**4,686,634**	**3,239,578**	**45,436,884**	**152,040**	**6,104,142**	**59,619,277**
12.2 සමුච්චිත ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය						
2020 ජනවාරි 1 වන දිනට ශේෂය	4,577,053	2,994,176	41,273,943	152,039	6,104,141	55,101,352
වසර සඳහා ගාස්තුව	64,671	32,015	1,432,181	-	-	1,528,867
වසර තුළ බැහැර කිරීම් / (මාරු කිරීම්)	-	-	-	-	-	-
2020 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**4,641,724**	**3,026,191**	**42,706,124**	**152,039**	**6,104,141**	**56,630,219**
2019 දෙසැම්බර් 31 දිනට	109,581	118,902	4,141,441	1	1	4,369,926
2020 දෙසැම්බර් 31 දිනට	**44,910**	**213,387**	**2,730,760**	**1**	**1**	**2,989,058**

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2020

සටහන **13.1** - දීර්ඝ කාලීන ආයෝජන	රු:	රු:
ස්ථාවර තැන්පතු	**27,141,741**	27,141,741
	27,141,741	27,141,741

සටහන **13.2** - කෙටි කාලීන ආයෝජන	රු:	රු:
ස්ථාවර තැන්පතු	**51,147,951**	41,844,050
	51,147,951	41,844,050

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මල්ලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2020

සටහන 14- බදු කුලී

සමාගම විසින් ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය (SLIDA) සමඟ බදු ගිවිසුමක් අත්සන් කර ඇති අතර එහිදී සමාගම විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ල බදු දීමට බදු දෙන්නා එකඟ වී ඇත. මෙම පිරිවැය 2003 ජනවාරි 1 සිට 2032 දෙසැම්බර් 31 දක්වා වසර 30 ක කාලයක් සඳහා කුලී අත්තිකාරමක් ලෙස සලකනු ලබන අතර වසර 30 කට වැඩි විස්තීරණ ආදායම් ප්‍රකාශය සඳහා කල්බදු අත්තිකාරම් ගෙවීම් අය කෙරේ. කෙසේ වුවත් බදු ගිවිසුම් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නැත.

	2020.	2019.
	රු:	රු:
ගෙවූ කුලී අත්තිකාරම්	**49,651,765**	49,651,765
එක් කළා - බදු වත්කම් පිරිවැය සඳහා බැලපුම්	**-**	-
	49,651,765	49,651,765
අඩු කළා: බදු කුලිය ලෙස ලියා හරින ලද මුල් මුදල්	**(28,136,003)**	(26,480,944)
වත්මන් වසරේ බදු ක්‍රමක්ෂය	**(1,655,059)**	(1,655,059)
කල්බදු වත්කම් සමුච්චිත ක්ෂය කිරීම් සඳහා බැලපීම්	**-**	-
	19,860,703	23,170,821

සටහන 15 - විලම්බිත බදුකරණය

	රු:	රු:
වසර ආරම්භයේදී	**7,081,483**	4,404,468
වසර සඳහා ප්‍රතිසාධනය / (ගාස්තුව)	**(566,930)**	2,677,015
වසර අවසානයේදී	**6,514,552**	7,081,483

මූල්‍ය වාර්තා කිරීමේ අරමුණු සඳහා සමාගමේ වත්කම් සහ වගකීම්වල වටිනාකම් සහ 14 ට අධ්‍යාපනික සේවාව සහ 28 පොළී ආදායම් මත පදනම් වූ බර කළ සාමාන්‍ය අනුපාතයට බදුකරණය සඳහා භාවිතා කරන මූදල් සහ පොලී ආදායම් අතර තාවකාලික වෙනස්කම් සඳහා ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බද්ද සපයනු ලැබේ.

වසර අවසානයේ විලම්බිත බදු වත්කම් පහත පරිදි වේ.

	2020		2019	
	තාවකාලික වෙනස	බදු බලපෑම්	තාවකාලික වෙනස	බදු බලපෑම්
	රු:	රු:	රු:	රු:
ඉදිරියට ගෙන ආ බදු පාඩුව	**31,268,598**	**5,815,506**	42,266,675	6,613,151
දේපළ, පිරියත සහ උපකරණ	**320,961**	**59,694.09**	(51,443)	(8,049)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	**3,437,645**	**639,352.15**	3,044,695	476,381
	35,027,204	**6,514,552**	45,259,927	7,081,483

වත්මන් මූල්‍ය වර්ෂය වෙත ගෙන එන ලද බදු අලාභය සම්බන්ධයෙන් කල් දැමූ බදු වත්කම් හඳුනාගෙන ඇත.

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2020

සටහන 16- වෙළෙඳ සහ වෙනත් ලැබීම්

	2020.	2019.
	රු:	රු:
වෙළෙඳ ලැබිය යුතු දෑ	**3,376,745**	5,413,059
අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් (සටහන 16.1)	**404,608**	279,000
ලැබිය යුතු පොළී	**2,903,981**	4,822,906
	6,685,335	10,514,965

16.1 - අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්

සේවකයන්ට ලබාදුන් වැටුප් අත්තිකාරම්	**240,000**	204,000
උත්සව අත්තිකාරම් ගිණුම	**81,000**	75,000
වැඩසටහන් සඳහා අත්තිකාරම්	**83,608**	-
	404,608	279,000

සටහන 17- අයකරගත යුතු ජංගම බදු

	රු:	රු:
ලැබිය යුතු රදවා ගැනීමේ බද්ද මත පොළී ආදායම	**759,039**	759,039
ආදායම් බද්ද - ස්වයං තක්සේරු ගෙවීම්	**484,223**	484,223
ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු	**512,980**	512,980
ලැබිය යුතු බදු ශේෂය (සටහන 17.1)	**2,864,509**	2,864,509
	4,620,751	4,620,751

සටහන 17.1 - DLC වෙත රු.2,864,509/-ක ආපසු ගෙවීමේ දැන්වීමක් ලැබී ඇත.

සටහන 18- මුදල් හා මුදල් සමාන දෑ

	රු:	රු:
මූනකර ශේෂයන්		
අතැති මුදල්	**25,000**	25,000
බැංකුවල මුදල් - ලංකා බැංකුව: ගිණුම් අංක. 0002323189	**916,622**	160,784
අරමුදල් කළමනාකරණ ගිණුම්	**15,371,997**	22,120,012
	16,313,620	22,305,796

සටහන 19 - ප්‍රකාශිත ප්‍රාග්ධනය

	රු:	රු:
නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවූ (සාමාන්‍ය කොටස් 14,206,509)	**142,065,090**	142,065,090
	142,065,090	142,065,090

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2020

සටහන 20 - සේවක ප්‍රතිලාභ

	2020.	2019.
	රු:	රු:
වසර ආරම්භයේදී ශේෂය	**3,044,695**	2,657,995
වසර තුළ සැපයූ ප්‍රතිපාදන / (ප්‍රත්‍යාවර්තන)	**392,950**	386,700
වසර අවසානය ශේෂය	**3,437,645**	3,044,695

සටහන 21- වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු

	රු:	රු:
වෙළෙඳ ගෙවීම්	**17,500**	17,500
උපචිත වියදම් (සටහන 21.1)	**3,392,828**	4,095,391
	3,410,328	4,112,891

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්
28/10, මලලසේකර මාවත, කොළඹ 07

මූල්‍ය ප්‍රකාශවලට සටහන් - 2020

සටහන - දෙසැම්බර් 31 වන දිනට උපචිත වියදම්	2020.	2019.
	රු:	රු:
ACCA පිරිවැය	**13,224**	-
මණ්ඩල රැස්වීම් සංග්‍රහ වියදම්	-	11,800
අතිකාල	**18,062**	30,029
පුවත්පත්	**1,060**	6,680
විදුලි වියදම්	**227,918**	692,138
ජලය	**3,240**	-
දිරි දීමනා	-	242,395
ප්‍රවාහන දීමනා	-	535,656
පිරිසිදු කිරීමේ ගාස්තු	**93,771**	155,541
දුරකථන	**37,762**	19,486
අන්තර්ජාල ගාස්තු	**123,428**	61,714
මුද්‍රණ සහ ලිපි ලේඛන	-	735
වෘත්තීය ගාස්තු	-	30,000
EPF	**188,045**	186,733
ETF	**28,207**	28,010
ගෙවත්න	**2,148**	20,644
මුද්දර ගාස්තු	**825**	825
මණ්ඩලය විසින් අනුමත කළ සූත්‍රයට අනුව විශේෂ ගෙවීම් / ප්‍රසාද දීමනා	**1,175,000**	1,175,000
03/2019 චක්‍රලේඛය අනුව විශේෂ ගෙවීම් / ප්‍රසාද දීමනා (සටහන 21.1.2)	-	148,500
ආර්ථික සේවා ගාස්තුව	-	77,246
විගණන ගාස්තු	**545,600**	345,600
වැටුප්	**580,000**	110,000
රදවාගැනීම් බදු	-	4,500
ඡායා පිටපත් යන්ත්‍ර කුලිය	**33,963**	105,012
උපකරණ නඩත්තුව	**77,988**	32,963
කාර්ය මණ්ඩල සුබ සාධනය	**8,700**	-
වැඩසටහන් සහය වැඩ පිරිවැය	**3,000**	6,600
ආදායම් බදු සහ පිරිවැටුම් ගොනුගත කිරීමේ ගාස්තු	**50,000**	50,000
EOEA වැඩසටහන් පිරිවැය	-	2,655
මුහුණට මුහුණ කෙරෙන වැඩසටහන් පිරිවැය	-	10,800
ඉන්ධන - සමාගමේ යතුරු පැදිය	-	1,000
මෝටර් වාහන නඩත්තුව	**4,980**	130
තේ වියදම්	**2,000**	3,000
ලේකම් ගාස්තු	**116,409**	-
පරිගණක පදනම් පුහුණුව -DLC පිරිවැය	**57,500**	-
	3,392,828	4,095,391

සටහන 21.1. 1 ප්‍රසාද දීමනා

ප්‍රසාද දීමනා / විශේෂ ගෙවීම් සඳහා ප්‍රතිපාදන, 2017 සිට 2019 දක්වා මණ්ඩලය විසින් අනුමත සූත්‍රයට අනුව සිදු කෙරිණි. DLC විසින් ඉහත ප්‍රසාද දීමනා යෝජනා ක්‍රමය එකඟතාව ලබා ගැනීමට PED වෙත ඉදිරිපත් කෙරිණි.

සටහන 21.1. 2 ප්‍රසාද දීමනා

2019 කාර්ය සාධනය සඳහා ප්‍රසාද දීමනා වන රු.148,500/- 2020 දී ගෙවන ලදී. වත්මන් වර්ෂයේ මුහුණ දෙන මෙහෙයුම් අලාභය හේතුවෙන් 2020 සඳහා ප්‍රතිපාදන සපයා නොමැත.

සටහන 22- අත්තිකාරම් ලැබීම්

	2020.	2019.
	රු:	රු:
ප්‍රසිද්ධ සම්මන්ත්‍රණය සඳහා ලැබුණු අත්තිකාරම	**12,000**	12,000
ලෝක බැංකු වැඩසටහන සඳහා ලැබුණු අත්තිකාරම	**339,190**	-
කාර්ය මණ්ඩලය වීනය වැඩසටහන සඳහා ලැබුණු අත්තිකාරම	**216,000**	-
	567,190	12,000

සටහන 23- ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

වර්ෂය තුළ අදාළ පාර්ශ්ව ගනුදෙනු කිසිවක් නොනිබුණි.

සටහන 23.1- ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS.24 අනුව "ආශ්‍රිත පාර්ශ්ව අනාවරණ ලබන ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු අස්ථිත්වයේ කටයුතු සැලසුම්කරණය, යොමු කිරීම සහ පාලනය කිරීම සඳහා අධිකාරිය සහ වගකීම ඇති පුද්ගලයන් ය. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස ලෙස හඳුනාගෙන ඇත.

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්

TIN : 134008989 0000

ඇගයීම් වසර 2020/2021

ගෙවිය යුතු ආදායම් බදු ගණනය කිරීම (කෙටුම්පත)

(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

බදු අය කළ හැකි ආදායම ගණනය කිරීම	සටහන්		
ව්‍යාපාරයෙන් තක්සේරු කළ හැකි ආදායම	***උපලේඛනය A***		-
ආයෝජනවලින් තක්සේරු කළ හැකි ආදායම			
ස්ථාවර තැන්පතු පොළී ආදායම		7,384,976	-
අරමුදල් කළමනාකරණ ගිණුම් මත පොළිය		522,286	
අඩු කළා ගිමිකම් කියූ පාඩු		(7,907,263)	-
බදු අය කළ හැකි ආදායම			-
ගෙවිය යුතු ආදායම් බදු			
අ. බදු අය කළ හැකි ආදායම් මත බදු			
අඩු අනුපාත යටතේ ආදායම් බද්ද මත බදු @ 14%		-	-
		-	-
අඩු කළා: බදු බැර			
ආර්ථික සේවා ගාස්තුව (ESC)	*6*	512,980	
රදවාගැනීමේ ණය			
වෙනත් සහන			(512,980)
ගෙවිය යුතු ශේෂ ආදායම් බදු / හෝ (ආදායම් බදු ආපසු ගෙවිය යුතු)			**(512,980)**

උපලේඛනය A

ඩිස්ටන්ට් ලර්නින් සෙන්ටර් ලිමිටඩ්

TIN : 134008989 0000

ඇගයීම් වසර **2020/2021**

ව්‍යාපාරයෙන් නක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීම (කෙටුම්පත)

(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

මූල්‍ය ප්‍රකාශන අනුව බදු වලට පෙර ලාභය/(අලාභය).				(3,799,409)
අඩු කළා	නිදහස් මුදල්ල අවසාන රදවා ගැනීමේ ගෙවීම් සහ වෙනත් මූලාශ්‍ර			
	ස්ථාවර තැන්පතු පොළී ආදායම		,384,976	
	අරමුදල් කළමනාකරණ ගිණුම් මත පොළිය		522,286	(7,907,263)
එකතු කළා	ඉඩ නොදෙන අඩු කිරීම්			
	පාරිතෝෂික ප්‍රතිපාදන	*1*	392,950	
	PPE මත ගිණුම්කරණ ක්ෂය කිරීම්		1,528,867	
	වෙනත් ප්‍රතිපාදන		670,000	2,591,817
අඩු කළා	ඉඩ දෙන අඩු කිරීම්			
	ගෙවන ලද පාරිතෝෂික		-	
	ක්ෂය කළ හැකි වත්කම් මත ප්‍රාග්ධන දීමනා	*3*	1,156,465	(1,156,465)
අඩු කළා	ගිමිකම් කියූ පාඩු			10,271,319
ව්‍යාපාරයෙන් නක්සේරු කළ හැකි ආදායම / (ව්‍යාපාරික පාඩුව)				-

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ කොටස්කරුවන්ගේ වාර්ෂික මහ සභා රැස්වීම 2023 පෙබරවාරි 21 වන අඟහරුවාදා දින ප.ව. 2.30ට කොළඹ 7, මළලසේකර මාවතේ, නො. 28/10 පිහිටි ලියාපදිංචි කාර්යාලයේ 4 වන මහළෙහි දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නඩාය පත්‍රය

1. රැස්වීම කැඳවීම පිළිබඳ දැන්වීම කියවීම
2. සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ විගණක වාර්තාව සමග 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන ගිණුම් වාර්තාව ලබා ගැනීම හා සලකා බැලීම.

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථාන අධ්‍යක්ෂ මණ්ඩලයේ
නියමය පරිදි
Accounting Systems Secretarial Services
(Private) Limited PV 4190

.....
අධ්‍යක්ෂ/ ලේකම්

දිනය : 2023 පෙබරවාරි 02

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

පෙරකලාසි ආකෘතිය

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ කොටස්කරුවකු/ කොටස්කරුවන් වන .....හි .....වන මම/ අපි* .....හි ..... හෝ ඔහුට/ ඇයට* නොහැකි අවස්ථාවක දී

කොළඹ ආචාර්ය සේරසිංහ පතිරණගේ ගීතාංගනී දමයන්ති ප්‍රදීපා හෝ ඇයට නොහැකි අවස්ථාවක

කොළඹ කලාවුවගේ දොන් නීල් රංජිත් අශෝක මහතා හෝ ඔහුට නොහැකි අවස්ථාවක

කොළඹ කරුණානායක නහන්නැහැලාගේ ඉන්දික ප්‍රේමරත්න මහතා හෝ ඔහුට නොහැකි අවස්ථාවක

කොළඹ කස්තුරි නානායක්කාරගේ නාලනී මල්කාන්ති ඛණ්ඩාර මෙය හෝ ඇයට නොහැකි අවස්ථාවක

කොළඹ මිෂෙල් අලීකී ටානියා පෙරේරා මෙය හෝ ඔහුට නොහැකි අවස්ථාවක

2023 පෙබරවාරි 21 වන සිකුරාදා ප ව 2.30 පැවැත්වීමට නියමිත සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීමෙහි දී සහ එහි කල්නැබුණු රැස්වීමක දී සහ එයින්මා මතු පවත්වන ඡන්දයක දී මා/ අප* වෙනුවෙන් මා/අප සඳහා* මාගේ/අපගේ* නියෝජිතයා ලෙස මෙයින් පත් කරමි/ කරමු.

.....

කොටස්කරුවාගේ අත්සන

2023 ..... දින අත්සන් තබන ලදී.

<u>පෙරකලාසි ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්.</u>

1. තමන් වෙනුවෙන් සහභාගි වීම හා ඡන්දය පාවිච්චි කිරීම සඳහා පෙරකලාසිකරුවකු පත් කිරීමට සාමාජිකයකුහට හිමිකම ඇත.
2. පෙරකලාසිකරුවකු සමාගමේ සාමාජිකයකු වීම අවශ්‍ය නොවේ.
3. රැස්වීමෙහි දී පෙරකලාසිකරුවකු මගින් ඡන්දය භාවිතා කිරීමට අවශ්‍ය සාමාජිකයකුට මෙහි දැක්වෙන ආකෘති පත්‍රය භාවිතා කළ හැකි අතර එයට "කථා කිරීමේ අයිතිය" ඇතුළත් කළ හැකිය.
4. වලංගුභාවය සඳහා සම්පූර්ණ කරන ලද පෙරකලාසි ආකෘති පත්‍රය රැස්වීමට පැය 48කට නොඅඩු කාලයකට පෙර සමාගමේ ලියාපදිංචි කරන ලද කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.
5. සමාගමක/ සංස්ථාවක පෙරකලාසිය එහි පොදු මුද්‍රාව යටතේ විය යුතු අතර එය මේ සමග යා කර එහි ව්‍යවස්ථා මගින් දක්වා ඇති ආකාරයට සහතික කර තිබිය යුතුය.